光而不燿。

චීනයේ ජීවත් වූ ල ඔන්සු නම්
අග්‍රගණයේ බුද්ධිමතා විසින්
හෙළි කරන ලද
ජයග්‍රහණයේ රහස් උපදෙස්
අසූ එකක් ඇතුළත්
සුවිශේෂී ග්‍රන්ථයකි.



# TAO TE CHING

තාඕ දර්ශනය හෙවත්

# සාර්ථකත්වයේ ස්වර්ණමය රහස්

නීතිඥ නිලන්ත හෙට්ටිගේ

Scanned with CamScanner

ඔබට නැතිවම බැරි පොතක්

# TAO-TE-CHING

## තාඕ දර්ශනය හෙවත්

# සාර්ථකත්වයේ ස්වර්ණමය රහස්

චීනයේ ජීවත් වූ ල ඔත්සු නම් අග්‍රගණ්‍ය බුද්ධිමතා විසින්
හෙළි කරන ලද ජයග්‍රහණයේ රහස් උපදෙස් අසූඑකක් ඇතුළත්ය.

Scanned with CamScanner

# කර්තෘගේ වෙනත් කෘතීන්

## බෞද්ධ ග්‍රන්ථ

01. භාවනාව සහ ආධ්‍යාත්මික දියුණුවේ රහස්
02. උසස් භාවනාව සහ අධිමානසික බලය
03. සමාධිය සහ ප්‍රඥාව වඩන ආනාපාන සති භාවනාව
04. භාවනාව මිනිස් සිත සහ නිවන
05. භාවනාව කුණ්ඩලිනී බලය සහ අධිමානසික විද්‍යාවේ රහස්
06. භාවනා රහස්
07. ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ භාවනාව
08. භාවනා උපදෙස් සහ සත්‍යාවබෝධයට නොවරදින මග
09. භාවනාව සහ චිත්ත ශක්තිය
10. භාවනාව යෝග සහ චිත්ත ශක්තිය
11. සතිපට්ඨාන භාවනාව සහ නිවන් මග
12. භාවනා උපදේශ සංග්‍රහය
13. භාවනා අභ්‍යාස සහ සත්‍යාවබෝධය
14. අධිමානසික විද්‍යාවේ හාස්කම්
15. බෞද්ධ භාවනා සහ මාර්ගඵල
16. විදර්ශනා භාවනාව සහ ධර්මාවබෝධය
17. අභිධර්ම ප්‍රවේශය
18. සදහම් සයුර
19. විදර්ශනා මාර්ගය
20. සෝවාන් මාර්ගය සහ සෝවාන් ඵලය
21. නුවණ වඩන බණකතා
22. භාවනාවේ හාස්කම්
23. ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය
24. භාවනා පුහුණුව
25. භාවනාව ධ්‍යාන සහ මාර්ගඵල විනිශ්චය
26. භාවනාවේ ආශ්චර්යය
27. සතරමග සතරපල
28. ප්‍රායෝගික විදර්ශනා භාවනාව
29. භාවනා මාර්ගය
30. භාවනාවේ විස්මිත රහස්
31. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සහ අක්ෂෝභ්‍ය තන්ත්‍රය
32. භාවනාවේ දිව්‍යමය රහස්
33. ධර්ම විනිශ්චය
34. කසිණ භාවනා රහස්
35. භාවනාවේ අනුහස්
36. සදහම් කැටපත
37. භාවනා අත්පොත
38. විපස්සනා භාවනාව
39. සදහම් සරණ
40. යෝග විද්‍යාවේ රහස්
41. බුද්ධානුස්සති භාවනාව
42. වජ්‍රසත්ව සූත්‍ර නිර්දේශය
43. භාවනාවේ ස්වර්ණමය රහස්
44. සසර ගමන සහ සෝවාන්ඵලය
45. බෞද්ධයාගේ භාවනා අත්පොත
46. භාවනාව සහ කුණ්ඩලිනී බලය
47. භාවනාව සහ අධිමානසික හැකියාව
48. සතිපට්ඨාන භාවනාව
49. යෝග විද්‍යා අත්පොත
50. මරණින් මතු ජීවිතය
51. භාවනාවේ ප්‍රවීණයකු වන මග
52. විමුක්ති මාර්ගය
53. විසුද්ධි මාර්ගය
54. සම්මා විමුක්ති
55. අසිරිමත් ටිබෙට් බුදුදහම
56. මහායෝගීන්ගේ භාවනා රහස්
57. මහා යෝගී පද්මසම්භව
58. සුවය සහ බලය ගෙනදෙන යෝග හා භාවනා ක්‍රම
59. ආනාපානසති භාවනාව
60. කසිණ භාවනා අත්පොත
61. ටිබෙට් භාවනා අත්පොත
62. භාවනාව සහ සුව කිරීමේ බලය
63. භාවනාවේ විස්මිත රහස්
64. භාවනාව සහ විස්මිත සුවකිරීම
65. භාවනාව මුල සිට සරලව

## මනෝවිද්‍යාව සහ දාර්ශනික මතවාද

66. ජීවිතයේ දියුණුවට දාර්ශනික රහස්
67. දියුණුව සහ ජයග්‍රහණය ගෙන දෙන ස්වර්ණමය රහස්
68. ධනය බලය සහ දියුණුව පිළිබඳ මනෝවිද්‍යාත්මක රහස්
69. සුපිරි මනස සහ සුපිරි බලය
70. එදිනෙදා ජීවිතයට අධිමානසික විද්‍යාව
71. ජීවිතයේ සාර්ථකත්වය සඳහා විස්මිත රහස්
72. ධනවත් වීමේ රහස්

## භාෂා අධ්‍යයනය

73. ඉංග්‍රීසියෙන් ලිපි ලේඛන සැකසීම
74. ප්‍රායෝගික ඉංග්‍රීසි කථනය
75. ඉංග්‍රීසි යෙදුම් අත්පොත

Scanned with CamScanner

76. ඉංග්‍රීසි ව්‍යාකරණ අත්පොත
77. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණයකු වන මග

## නීතිය

75. අපරාධ නීතිය
79. පොදුජන නීති අත්පොත
80. ඉඩම් නීතිය
81. විවාහය සහ නීතිය
82. ජීවිතය සහ නීතිය
83. ඔබට බලපාන නීතිය
84. නීතිය යුක්තිය සහ අධිකරණය
85. නීතිය සහ නීතියේ ක්‍රියාකාරිත්වය
86. ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය
87. සාක්ෂි නීතිය සහ නඩු ඇසීමේ ක්‍රියාවලිය
88. එදිනෙදා ජීවිතයේ නීති ගැටලු
89. සිවිල් නීතිය සහ නඩු කාර්ය පටිපාටිය
90. සාක්ෂි නීතිය
91. කම්කරු නීතිය
92. අපරාධ නීතියේ මූලධර්ම
93. අපරාධ නඩු විධාන නීතිය
94. අපරාධ නීතිය සහ සාපරාධී වගකීම
95. පොදු ජන නීති අත්පොත නව සංස්කරණය
96. අපරාධ නීතිය සහ දණ්ඩ නීති සංග්‍රහය
97. පරිපාලන නීතිය සහ සේවක අයිතිවාසිකම්
98. ප්‍රායෝගික ඉඩම් නීතිය
99. ඉඩම් නීතියේ සංකල්ප සහ භාවිතය
100. නීති ප්‍රවේශය
101. මෝටර් රථ ප්‍රවාහන නීතිය
102. ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය
103. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත
104. ඉඩම් ආරවුල් සහ හැටහය වන වගන්තියේ නඩු
105. ශ්‍රී ලංකාවේ ඉඩම් නීතිය
106. රිය පැදවීමේ නීති අත්පොත
107. පොදු ජනතා පොදු ගැටලුවලට නීති විසඳුම්
108. බෙදුම් නඩු නීතිය
109. ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය
110. අධිකරණ ක්‍රමය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය
111. විවාහ නීති අත්පොත
112. අපරාධ නීති අත්පොත
113. සිවිල් නඩු විධාන නීතිය
114. ඔප්පු ලිවීමේ නීතිය
115. ඉඩම් නීති අත්පොත
116. එදිනෙදා ජීවිතයට නීති උපදෙස්
117. නීතිය සැමට
118. අභියාචනා නීතිය
119. ජන දිවියට නීතිය
120. තහනම් නියෝග පිළිබඳ නීතිය
121. මූලික අයිතිවාසිකම් පිළිබඳ නීතිය
122. කම්කරු නීතිය සහ කම්කරු උසාවිය
123. ඉඩම් නීතිය මුල සිට සරලව
124. අපරාධ නීතියේ මූලිකාංග
125. විවාහය දික්කසාදය සහ නඩත්තු පිළිබඳ නීති
126. නීතිය සහ උසාවි ක්‍රමය
127. මාර්ග නීති අත්පොත
128. නඩු කටයුතු පිළිබඳ අත්පොත
129. නීතිය සහ අධිකරණ බලය
130. පොලිසිය සහ නීතිය
131. මානව හිමිකම් පිළිබඳ නීතිය
132. වංචා වැළැක්වීමේ නීතිය
133. බෙදුම් නඩු කාර්ය පටිපාටිය
134. අභියාචනය සහ ප්‍රතිශෝධනය

## වෙනත් කෘතීන්

135. සටන් කලාව
136. ගුප්ත විද්‍යාව සහ අමනුස්ස ලෝකය
137. ජීවිතය සහ මරණය පිළිබඳ විස්මිත රහස්
138. අන්තරාභවය සහ මළවුන්ගේ ලෝකය
139. මළවුන්ගේ ලෝකයේ අභිරහස්
140. විශ්ව ශක්තිය සහ සුවකිරීමේ බලය
141. විශ්වයේ විස්මිත අභිරහස්
142. ගුප්ත විද්‍යාව සහ අධිමානසික හැකියාව
143. ගුප්ත විද්‍යාවේ රහස්
144. ඩිජිටල් ඡායාරූපකරණය
145. පිටසක්වළ ජීවීන්ගේ විස්මිත රහස්
146. අමනුස්ස ලෝකයේ අභිරහස්
147. නවීන විද්‍යාවේ හාස්කම්
148. ලොව හෙල්ලූ විස්මිත අභිරහස්
149. නවීන විද්‍යාවේ හාස්කම්
150. සටන් කලා අත්පොත
151. මළවුන්ගේ ලෝකයේ විස්මිත රහස්
152. ලොව හෙල්ලූ විස්මිත අනාවැකි
153. සිව් හෙළයට අධිපති රාවණා
154. මහා යෝගියෙකු සමඟ දොළොස් වසරක්
155. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත

CS Scanned with CamScanner

CS Scanned with CamScanner

ඔබට නැතිවම බැරි පොතක්

# TAO-TE-CHING

තාඕ දර්ශනය හෙවත්

# සාර්ථකත්වයේ ස්වර්ණමය රහස්

චීනයේ ජීවත් වූ ල ඔත්සු නම් අග්‍රගණ්‍ය බුද්ධිමතා විසින්
හෙළි කරන ලද ජයග්‍රහණයේ රහස් උපදෙස් අසූවකක් ඇතුළත්ය.

**නීතිඥ නිලන්ත හෙට්ටිගේ**

සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597

CS Scanned with CamScanner

මෙම පොතෙහි අඩංගු කරුණු හා තොරතුරු කර්තෘගේ අදහස් මිස
ප්‍රකාශකයාගේ අදහස් නොවන බව කරුණාවෙන් සලකන්න.

**තාඕ දර්ශනය හෙවත් සාර්ථකත්වයේ ස්වර්ණමය රහස්**

© නීතිඥ - නිලන්ත හෙට්ටිගේ

ප්‍රථම මුද්‍රණය - 2018 පෙබරවාරි

**ISBN 978-955-33-0822-1**

Agreement No: 1789

**පරිගණක පිටු සැලසුම**
ඩිලන්ත මුතුගල

**මුද්‍රණය**
සුසර මුද්‍රණාලය
නො: 338/*A*, ගෝනහේන, කඩවත.

**ප්‍රකාශනය හා බෙදාහැරීම**
සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597
*E-mail: susarapub@gmail.com*
*Web: www.susarapublication.lk*
*Facebook: www.facebook.com/susarapublications*

Scanned with CamScanner

# පෙරවදන

පුද්ගල සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයට අදාළව දැනට දශකයකට පමණ කාලයකට පෙර මවිසින් පොත් පෙළක් ලියා එළිදක්වනු ලැබීය. ඒ පොත් බොහෝ දෙනෙකුගේ පැසසුමට පාත්‍රවිය. තවත් එවැනි පොතපත ලියා පළ කරන මෙන් තවමත් මට ඇරයුම් ලැබෙයි. මෙම කෘතිය ලියා පළ කරන්නට යෙදෙනුයේ ඒ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙනි.

චීනය ලොව බලවත්ම රාජ්‍යයන්ගෙන් එකකි. මහජන චීන සමූහාණ්ඩුව තවත් දශක කිහිපයක් තුළ ඇමෙරිකා එක්සත් ජනපදයද අභිබවා ආර්ථික සංවර්ධනයේ ඉහළම ඉලක්කයන් සපුරා ගනු ඇති බවට අනාවැකියක් පවතියි. එමෙන්ම චීනය දැනට පවත්නා පැරණිතම රාජ්‍යයන්ගෙන් එකකි.

ලොව සියලු රටවල් අභිබවා චීනයට නැගී සිටීමට හැකිවූයේ සුවිශේෂී දාර්ශනික රහස් කිහිපයක් නිසා බව කියැවේ. ඒ දාර්ශනික රහස්වල නිර්මාතෘ ල ඔට්සෙ නම් වෙයි. ල ඔට්සෙ විසින් නිර්මාණය මුල්වරට හෙළිකරන ලද රහස් ඉගැන්වීම් තාඕ දර්ශනය ලෙස ප්‍රසිද්ධ විය. එය පසුකාලීනව තාඕ ආගමට අවශ්‍ය දාර්ශනික පසුබිම නිර්මාණය කළේය.

චීනයේ පාරම්පරික සටන් කලාව, වෛද්‍ය විද්‍යාව සහ ගෘහ නිර්මාණ ශිල්පය ඇතුළු සියලු විද්‍යාවන්හි තාඕ රීති අඩු වැඩි වශයෙන් භාවිත වෙයි.

දැනට වසර දහයකට පමණ පෙර තාඕවාදය හඳුන්වා දෙමින් 'ජීවිතයේ දියුණුවට දාර්ශනික රහස්' යන මාතෘකාව යටතේ පොතක් ලියා පළ කළෙමි. එහි තාඕවාදයේ මූලික සංකල්ප කිහිපයක් පමණක් විස්තර කෙරුණි. නමුත් ඒ පොත බොහෝ දෙනෙක් තවමත් ඉල්ලන පොතකි.

Scanned with CamScanner

ල ඔට්සුගේ ඉගැන්වීම්වලින් නොනැවතී සුන් ත්සු, ඊ චිං වැනි ලේඛකයන්ගේ වටිනා අදහස්ද ඇතුළත් කර අලුත් පොතක් ලියා පළ කිරීම කාලීන අවශ්‍යතාවක් වේ. එහි මුල් පියවර ලෙස ල ඔට්සුගේ ඉගැන්වීම් ආශ්‍රයෙන් මේ පොත ලියා සකස් කළෙමි.

මේ පොතෙහි එන එක් එක් පාඩමෙහි මතුපිට වචනාර්ථයට යටින් සරලව තේරුම් ගැනීමට අපහසු ලෝක සත්‍යයන් ගැබ්ව ඇති බව පාඨකයා සැලකිල්ලට ගත යුතුය. එබැවින් මෙය වරක් කියවීමෙන් සෑහීමට පත් නොවී කිහිපවරක් ප්‍රවේසමෙන් කියවා බලා මෙහි එන දාර්ශනික සත්‍යයන් අවබෝධ කරගනු මැනවි.

නීතිඥ නිලන්ත හෙට්ටිගේ

CS Scanned with CamScanner

# ලඔට්සු සහ තාඕවාදය

ලා ඔට්සු නැතහොත් ල ඔට්සෙ යන නාමය ශ්‍රී ලාංකේය පාඨකයන්ට තරමක් නුහුරු විය හැකිය. එනමුත් ඔහු ලෝකයේ දැනටත් වැඩිපුරම විකිණෙන කෘතියක කර්තෘවරයා වෙයි. ල ඔට්සු එතරම් ප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයකු වුවත් ඔහු විසින් ලියන ලද තාඕ තෙචිං නම් ග්‍රන්ථය පුදුමාකාර ජනප්‍රියත්වයක් ඇති එකකි.

තාඕ තෙචිං මුල් කෘතිය ඉපැරණි චීන භාෂාවෙන් ලියැවුණු එකකි. ඉපැරණි චීන භාෂාවෙහි රූපාක්ෂර තේරුම් ගැනීමේ දුෂ්කරතාව නිසා තා ඕ තේ චිං කෘතිය මෙතෙක් කිසිවකු විසින් සර්ව සම්පූර්ණ ලෙස පරිවර්තනය කර නොමැති බැව් කියැවෙයි. ඒ කෙසේ වෙතත් එහි අභ්‍යන්තරය තුළින් දිවයන පරමාර්ථ සත්‍යයන් ඒ පරිවර්තිත කෘතීන් තුළින් උපුටා ගැනීම අපහසු නැත.

තාඕ තේ චිං කෘතියේ ආරම්භය ගැන ඇත්තේ අපූරු කතාවකි. එහි කර්තෘවරයා දැනට වසර දෙදහස් පන්සියකටත් වඩා පෙර චීන කහ අධිරාජ්‍යය තුළ ජීවත්වූවෙකි. ල ඔට්සෙ නමින් හැඳින්වූ ඔහු චීන අධිරාජයාගේ අධිකරණයේ ලේඛනාගාර භාරකරු විය.

අමුතු ගතිපැවතුම් ඇති ඒ මිනිසාගේ පඬිවදන් ඇසීමට කහ අධිරාජයා ප්‍රිය කළේය. නමුත් ඔහු කිසි දින ල ඔට්සෙ කියන පරමාර්ථයන් වෙත ළංවීමට උත්සාහ නොකළේය.

අසූවිය පිරුණු ල ඔට්සෙ ලේඛනාගාරයේ රැකියාවෙන් ඉවත් වී චීනය අතහැර ටිබෙට් රටෙහි පදිංචියට යාමට තීරණය කළේය. ඔහු රට හැර යාමට ප්‍රධාන හේතුව ඔහු කී අලුත් දර්ශනවාදය කිසිවකු විසින් වටහා නොගැනීමයි.

ල ඔට්සෙ චීන දේශසීමාව පසුකරමින් සිටින අතර මුරකරුවෙක් විසින් ඔහුව හඳුනාගනු ලැබුණි. ලෝක සත්‍යයන්

Scanned with CamScanner

පිළිබඳව පොතක් ලියා දෙන ලෙස හේ ලඕට්සෙගෙන් ඉල්ලා සිටියේය.

මුරකරුගේ ඉල්ලීම අහක ලිය නොහැකි බැවින් ලඕට්සෙ පරිච්ඡේද අසූඑකකින් යුත් කෘතියක් නිර්මාණය කළේය. ඒ එක් එක් පරිච්ඡේදයන් කාව්‍යයන් ආකාරයට සකස් වුවද පසු කාලීන සංස්කරණයන් තුළින් යම් යම් වෙනස්කම් සිදුවන්නට ඇති බව පෙනෙයි.

කෙසේ වෙතත් සියවස් ගණනාවක් යන විට ලාඕට්සෙ විසින් හඳුන්වා දුන් ඉගැන්වීම් තාඕවාදය ලෙස ජනප්‍රිය විය. පසුකාලීනව තාඕ ආගම ඇතිවූයේද තාඕ සංකල්ප මත පිහිටා සිටීමෙනි.

මෙහි තාඕව යන වදන නිතර හමුවෙයි. ඊට දිය හැකි අරුත් ගණනාවකි. තාඕ හෙවත් දඕ යන චීන වදනේ සරල තේරුම ක්‍රමවේදය යන්නයි. පරම සත්‍යය, ස්වභාව ධර්මයේ රීතීන්, ලෝක සත්‍යය වැනි අර්ථයන්ද ඒ වදනින් අදහස් වෙයි.

CS Scanned with CamScanner

## 01

## පරමාර්ථ සත්‍යය නම් සියල්ල ශූන්‍ය බවයි

යම් ඉගැන්වීමක් වචනයෙන් විස්තර කළ හැකි නම් එය පරමාර්ථ සත්‍යය (තාඕව) නොවේ. යමකට නමක් ඇත්නම් එය එහි යථා ස්වරූපයට දිය යුතු නම නොවේ. විශ්වීය යථා ස්වරූපයට නමක් දිය නොහැකිය. නම් කිරීම ආරම්භ වීමෙන් පසු සම්මුති සත්‍යයන්ගේ ආරම්භය ඇතිවිය. පරමාර්ථ සත්‍යය ග්‍රහණය කරන පුද්ගලයා සියලු ලෞකික ආශාවෙන් සිත මුදවා හරියි. ආශාවන්ගෙන් තෙත්වූ මනස හුදු මනෝනිර්මිත ලෝකයක් මත විශ්වාසය තබයි. පරමාර්ථ සත්‍යයත් සම්මුති සත්‍යයත් පැනනඟිනුයේ එකම මූලයකිනි. ඒ මූලය අනෙකක් නොව, පරම ශූන්‍යතාවයි. පරම ශූන්‍යතාවය යනු සම්මත ලෝකයේ ඇති ශූන්‍යතාවයේද එහා පිහිටි ධර්මතාවයකි. පරම ශූන්‍යතාවය පිළිබඳ අවබෝධය යථාභූත ඥාන දර්ශනය ලෙස නම් කළ හැකිය.

## 02

## සැමට සමව සැලකීම ජයග්‍රහණයේ මාවතයි

මිනිසුන් යමක් ලස්සන බව දකින කල තවත් යමක් අවලස්සන බව පෙනෙනු ඇත. යමක් හොඳ බව දකින විට තවත් යමක් නරක බව පෙනෙනු ඇත.



Scanned with CamScanner

පැවැත්ම හා නොපැවැත්ම එකක් අනෙක මත රඳා පවතියි. පහසුව හා අපහසුවද එවැනිම සංකල්පයන් දෙකකි. ඒවාද එකක් අනෙක මත රඳා පවතින්නේය. දිගුබව හා කෙටිබව මෙයාකාරයේම සංකල්පයන් දෙකකි. උස් හා මිටි බවද එකක් අනෙක මත රඳා පවතියි. පෙර හා පසුව යන්නද මෙලෙසම එකක් අනෙක මත රඳා පවතින සංකල්ප දෙකකි.

එබැවින් මේ ගැන තේරුම්ගත් මුනිවරු කිසිවක් නොකිරීම යන ක්‍රියාව තෝරාගනිති. ඔවුහු කිසිවක් නොකීම මගින් ඉගැන්වීමට දනිති. ඔවුහු ඉන්ද්‍රිය ගෝචර වූ දේ මත සංකල්ප මැවීමෙන් තොරව ඒවාට යන්න දෙති. යමක් අහිමි වූ කල මුනිවරු ඊට නොසැලෙති.

මුනිවරු කිසිදු භෞතික වස්තුවක් නතු කර නොගනිති. ඔවුහු සමාජ සේවයේ යෙදෙති. නමුත් කිසිදු ප්‍රත්‍යුපකාරයක් බලාපොරොත්තු නොවෙති. තමන්ගේ කාර්යය ඉටුවූ පසු ඔවුහු එය අමතක කර දමති. මුනිවරුන් කාලයේ මානයෙන් මිදී සදාකල් ජීවත් වන්නේ යයි කියනුයේ එබැවිනි.

## 03

## දුෂ්ට පාලකයන් මිනිසුන් ජෝද කරවා රට කරවන බව තේරුම් ගන්න

මිනිසුනි, ඔබ පාලකයන්ට පමණට වඩා ගරු කළහොත් ඔවුන් සාමාන්‍ය මිනිසුන්ට පහත් ලෙස සැලකීමට පුරුදු වනු ඇත. ඔබ පමණට වඩා පුරාජෞවට ජීවත් වුවහොත් සොරුන් ඔබගේ ධනය පැහැරගනු ඇත.

කපටි පාලකයා මිනිසුන්ගේ බඩගෙඩි පුරවා තබා ඔළුගෙඩි හිස්ව තබයි. ඔහු මිනිසුන්ගේ දුරස්ථ ඉලක්ක



Scanned with CamScanner

අමතක කරවා සමීප ඉලක්ක වෙතට ඔවුන් යොමු කරවයි. ඔහු මිනිසුන්ගේ ධන සම්පත් සූරාගෙන ඔවුනොවුන් අතර භේද ඇතිකර සිය පාලන යාන්ත්‍රණය සාර්ථක කර ගනියි.

කපටි පාලකයා උගතුන්ගේ දැනුම පවා අවුල් වියවුල් කරවා දමයි. (ධර්මිෂ්ඨ පාලකයා) සියලු දෙයම සුදුසු තැන්හි තබයි.

## 04

## සියල්ල පරම ශූන්‍යතාවයෙන් පැන නගියි

තාඕව ගැඹුරු ළිඳකට සමකළ හැකිය. එහි ජලය කෙතෙක් පරිභෝජනය කළද අවසන් නොවේ. පරමශූන්‍යතාවද එවැනි එකකි. පරමාර්ථ වශයෙන් ගත් කල පරම ශූන්‍යතාවද හිස් නොවේ. මන්දයත් සියලු විය හැකි දේ පරම ශූන්‍යතාවය තුළින් පැන නගින බැවිනි.

(තාඕව) ප්‍රකටව නොපවතින නමුත් සෑම තැනකම ඇති ධර්මතාවකි. තාඕව කවදා කවුරු නිර්මාණය කළාද කීමට නොහැකිය. එනමුත් (මනෝනිර්මිතයක් වන) තාඕව දෙවියන්ටද වඩා පැරණි ධර්මතාවකි.

## 05

## අපක්ෂපාතී වූවෝ සදාකල්හි ජයගනිති

තාඕව කිසිදු පක්ෂග්‍රාහීභාවයක් නොදක්වන ධර්මතාවයකි. හොඳ හා නරක යන ධර්මතාවයන් දෙකෙහිම උපත එහි පිහිටියේය. (ඒ කරුණු වටහාගත්) මුනිවරයා



Scanned with CamScanner

අපක්ෂපාතීව වාසය කරයි. ඔහු සුදනන්ද දුදනන්ද (වෙනසකින් තොරව) ආශ්‍රය කරයි.

තාඕව මයිනාහමකට සම කළ හැකිය. තාඕව ශූන්‍යතාවට සමවන මුත් ඉන් කළ හැකි දේ අපමණය. තාඕව භාවිත කරන තරමට ඉන් වැඩි වැඩියෙන් ප්‍රයෝජන අත්වෙයි. එනමුත් තාඕව ගැන වැඩි වැඩියෙන් කතා කරන තරමට ඔබ එය වටහාගන්නා ප්‍රමාණය අඩුවෙයි.

මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම (තාඕව අනුව ජීවත් වීමේ) නිවැරදි මාවතයි.

06

## සොබාදහමේ රීති හැම තැනටම පොදුය

තාඕව සියලු මවුවරුන්ගේ මව වැනිය. එය ශූන්‍ය වූ නමුත් එහි ප්‍රයෝජන ගෙන අවසන් කළ නොහැකිය. පරම ශූන්‍යතාවයෙන් ඇරඹී අපරිමිත ලෝකධාතු සංඛ්‍යාවක් බිහිවිය.

තාඕව ඔබ තුළින්ම ලබා ගත හැකි ප්‍රතිඵලයකි. ඔබ කැමති ඕනෑ විටක තාඕව භාවිත කිරීමේ හැකියාව ඇත.

07

## ඇලීම් ගැටීම්වලින් මිදීම සැබෑ ජයග්‍රහණයේ මාවතයි

තාඕව සනාතන ධර්මතාවකි. තාඕව කිසිදින නොඉපදුණු කිසිදින නොමියෙන ධර්මතාවකි. තාඕව අපරිමිත ධර්මතාවකි. එය අපරිමිත වනුයේ මන්ද? තාඕව තුළ



CS Scanned with CamScanner

කැමැත්ත හෝ නොකැමැත්ත නොපිහිටයි. ඒ තුළ මමත්වය නොපිහිටයි. එය සෑම කෙනෙකුටම විවෘත ධර්මතාවකි.

(තාඕව දත්) මුනිවරයා සියල්ලන්ට ඉස්සර වීමට ඉඩ දී තෙමේ පසුපසින් යයි. ඔහු සියල්ලන්ට ඉඩදුන් බැවින් සියල්ලන්ට වඩා ඉදිරියෙන් සිටින්නේ යයි කියනු ලැබේ. මුනිවරයා ලෝකයේම වෙසෙමින් ලෝකයෙහි ඇලීම් ගැටීම් නොමැතිව වාසය කරයි. මුනිවරයා ලෝකයේ සියලු සිදුවීම් ගලාගෙන යාමට ඉඩ දී සන්සුන් සිතින් වාසය කරයි. මන්දයත් ලෝකයෙන් ඔහුට ලබාගත යුතු දෙය ලබාගත් බැවිනි.

## 08

## මහ පොළොවට බරක් නොවන සේ ජීවත් වන්න

යහපත්කම වැසිදිය හා සම කළ හැකිය. මන්දයත් වැසිදිය සියලු බිම් වෙනසක් නැතිව තෙමා හරින බැවිනි. වැසිදිය ගලා බසින්නාක් මෙන් යහපත් තැනැත්තා තම කුළුණු ගුණය වෙනසක් නොමැතිව පතුරවා හරියි. සියල්ලන් කෙරෙහි දක්වන සමගුණය තාඕවේ එක් ලක්ෂණයකි.

ජීවත්වන්නː මහපොළවට සමීපව

සිතන්නː හැකිතාක් සරලව

සටන් වදින්නː කාරුණිකව හා සාධාරණ ලෙස

පාලනය කරන්නː මිනිසුන්ට නොදැනෙන ලෙස

ජීවිකාවෙහි යෙදෙන්නː ඔබ වඩාත් සතුටු දෙය සමග

නිවසෙහි රැඳෙන්නː සියලු දෙන එකා මෙන්

සතුටුවන්නː ඔබ ලද දෙයින් සෑනහී

තරග නොකරන්නː සැසඳීමට නොයන්න

සියලු දෙන ගරු කරතිː එකල්හි ඔබ හට



Scanned with CamScanner

09

## ජීවිතය මුදලට යට නොකරන්න

බඳුනකට සීමාව ඉක්මවා දිය පුරවන්නේද එය පිරී ඉතිරී ඉහිරී යන්නේය. පිහියක් පමණ ඉක්මවා මුවහත් කරන්නේද එය ගෙවී මුවාත නැතිව යන්නේය. මුදල් පසුපස හඹායන්නේද ජීවිතය මුදලට යට වී යන්නේය. මිනිසුන්ගේ විවේචන පමණ ඉක්මවා ගරු කරන්නේද ඔබ යම් දිනෙක (සිතින්) වහලකු බවට පත් වන්නේය. ඔබට අයිති කාර්යය කරන්න. ඉන්පසු ඉවත්ව යන්න. (සියල්ල සිතින් අත්හැර) නිදහසේ ජීවත්වන්න.

10

## මනුෂ්‍ය වර්ගයාට ආදරය කරන්න

පුහුදුන් මනස අරමුණු පසුපස හඹා යයි. අරමුණුවලින් මුදවා ගත් සිත ස්වභාවික සිසිලෙහි නිසල වෙයි. ස්වභාවික තත්වයට පත්වූ සිත අලුත උපන් බිළිඳකුගේ සිත්හි සවභාවය සමඟ සැසඳිය හැකිවෙයි. සියලු අරමුණුවලින් මනස හිස්කරන්න. අවසානයේ අභ්‍යන්තර සාමයේ ආලෝකය ඔබ අත්විඳිනු ඇත.

මනුෂ්‍ය වර්ගයාට ආදරය කරන්න. ආපිට උදව්වක් බලාපොරොත්තු නොවී ඔවුන් සුමඟට මෙහෙයවන්න. සියලු කටයුතු හොඳ අවධානයෙන් කරන්න.

එනමුත් ප්‍රතිඵල ගැන කරදර නොවන්න. ආපසු හැරී (ලෝකය දෙස) බලන්න. එකල්හි සියලු දෙය අවබෝධ වනු ඇත.



Scanned with CamScanner

## 11

## නැති බවත් සතුටට හේතුවකි

වාහනයක රෝදයක් ගැන මොහෙතකට සිතමු. රෝදයේ ගරාදි බොස්ගෙඩියට සවි වී ඇත. බොස්ගෙඩිය මැද තනි සිදුරකි. ඒ සිදුර නොමැත්තේ නම් වාහනය ගමන් කරවිය නොහැක්කේය.

මැටි කළයක් ගැන මොහොතකට සිතමු. එහි ප්‍රයෝජනවත් අංගය වටේ ඇති මැටි කටුව නොව මැද ඇති සිදුරම වෙයි. ඔවට වැදගත් දෙය අසුරනුයේ ඒ හිස් ඉඩ තුළය. නිවසක් ගැන මොහොතකට සිතමු.

වටිනා භාවිතය ඇත්තේ නිවසට යොදන ලද දැව දඬු තුළ නොව නිවස තුළ ඇති හිම් ඉඩකඩෙහිය. නිවස තුළ ඉඩකඩ නොමැති නම් එහි නිවැසියන්ට විසිය නොහැකි වනු ඇත.

ඇත යන්න පිළිබඳව අපි පමණට වඩා වෙහෙසෙමු. නැත යන ස්වභාවයේ වටිනාකම ලොවට අමතක වී ඇත.

## 12

## ලෝකාස්වාදයේ පමණ දැන ගන්න

පමණට වඩා සැර ආලෝකය වැටුණොත් දැස් කණ වනු ඇත. පමණට වැඩි ශබ්දයෙන් බිහිරි බවට පත්වනු ඇත. පමණට වඩා තුනපහ යොදුවොත් ආහාර විෂ වනු ඇත. පමණට වඩා සිතන්න ගියහොත් සිතීමේ ශක්තියද මොට වනු ඇත.



Scanned with CamScanner

පමණට වඩා (යමකට) ඇලුම් කරතොත් දුක තුනීකරගත නොහැකි වනු ඇත.

මුනිවරු පුහුදුන් ලෝකය නිරීක්ෂණය කරමින්ද ස්වකීය අන්තර්ඥානය ගැන විශ්වාස කරමින්ද (ඇලීම් ගැටීම් නොමැතිව) වාසය කරති.

මුනිවරු ලෝකයේ සිදුවන වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවකින් තොරවම වාසය කරති. මුනිවරයකුගේ මනස හිස් අහස මෙන් පිරිසිදුය.

## 13

## පැදුරෙන් බිමට ඇද දැමිය නොහැකිය

පරාජය මෙන්ම ජයග්‍රහණයද අනතුරකි. බලාපොරොත්තුව විසින් එවැනිම අනතුරක් නිර්මාණය කරනු ඇත.

ජයග්‍රහණය පරාජය මෙන්ම අනතුරක් වන්නේ මක්නිසාද යත්? ඉණිමගක උඩට නගින මිනිසා බිමට වැටීමේ අවදානමකට පැමිණෙයි.

යමකු මහ පොළව මත පය තබා ජීවත් වුවහොත් ඔහු ඇදවැටීමේ අන්තරායෙන් මිදී ජීවිතයට සමබරව මුහුණ දෙයි. බලාපොරොත්තුවත් බියත් යන දෙකම පරමාර්ථ වශයෙන් හිස්වූ ඒවාය.

මන්දයත් ඒ චිත්තභාවයන් දෙකම හුදු ආත්මාර්ථය උදෙසා නිර්මාණය වූ බැවිනි. මමත්වයෙන් මිදී නිදහස් වූ කල්හි බිය වීමට හේතුවක්ද ඉතිරි නොවේ.



CS Scanned with CamScanner

14

# නාඹව සියලු ආරම්භයන්හි ඇරඹුමයි

බැලුවත් දැකිය නොහැකි
කන් දුන්නත් ඇසිය නොහැකි
ළං වූවත් ඇල්ලිය නොහැකි
ඉහළ බැලුවත් අහස නොපෙනෙන
පහළ බැලුවත් අඳුර නොපෙනෙන
නමක් ලබා දීමටද නොහැකි
පරම ශූන්‍යතාවයෙහි පවතින
එනමුත් සියලු නිමැවුම්වල මූලය වන
සියලු පිළිබිඹුවල මූලය වන
සිතින් සිතා ගැනීමටවත් නොහැකි
තැනක් වෙයි කොතැනද එය?
එතැනට පැමිණි කල්හි ආරම්භයක් දැකිය නොහැකිය.
එතැනින් ආරම්භ කළ කල්හි
අවසානයක් දැකිය නොහැකිය.
කිසිවකුගේ දැනුමට හසු නොවන
එනමුත් තමන්ට එතැනට පැමිණිය හැකි
තැනක් වෙයි කොතැනද එය?
ඔබ මෙහි ආවේ කොයි සිටද?
අන්න එතැනයි ඒ නවාතැන.



CS Scanned with CamScanner

## 15

# තමන්ගේ වේලාව එනතුරු ඉවසන්න

පුරාතන ගුරුවරු තියුණු මනසින් යුතු සියුම් කල්පනාව ඇති අය වූහ. ඔවුන්ගේ අන්තර්ඥානය පතුළ නොපෙනෙන තරම් ගැඹුරු විය. ඔවුන්ගේ ඥානයේ තරම වචනවලින් කීමට පවා නොහැකිය.

නමුත් අපට කළ හැකි දෙය නම් ඒ මුනිවරුන්ගේ හැඩරුව මතුපිටින් ගෙන විස්තර කිරීම පමණි. ඒ මුනිවරුන් ජීවිතය පරිස්සමෙන් ගෙන ගියේ සිසිර කාලයේ මිදුණු ගංගාවක් මත සෙමින් සෙමින් අඩිතබා ඇවිදින්නාක් මෙනි.

සතුරු රටකට රහසින් ඇතුළු වූ යුද සෙබළකු මෙන්ද හිම දිය වී සෙමින් සෙමින් ගලා ගෙන යන්නාක් මෙන්ද ඔවුහු ප්‍රවේසම් සහගත ජීවිත ගත කළහ.

මුනිවරුන්ගේ කාර්ය ශූරත්වය කැමති විදියකට හැසිරවිය හැකි ලී කොටයක් මෙනි. ඔවුන්ගේ සම ගුණය මිටියාවතක් මෙනි. ඔවුන්ගේ සිත්හි පිරිසිදුකම වීදුරු බඳුනකට දැමූ පිරිසිදු වතුර මෙනි.

මඩ වතුර බඳුනක් පිරිසිදු කරන්නට නම් නිසලව තබා ඉවසා බලා සිටීම ප්‍රමාණවත්ය. නැණවතා තම අරමුණ ඉටුවන තෙක් එයාකාරයෙන් ඉවසිලිමත්ව සිටිනු ඇත. තමන්ට යෝග්‍ය පරිදි වටපිටාව සැකසෙන තෙක් ඉවසිල්ලෙන් බලා සිටිනු ඇත.

මුනිවරුන්ට අරමුණු නොමැත. බලාපොරොත්තුද නොමැත. සෙවීමක් අලුතින් ඉගෙනීමක්ද නැත. වර්තමානය සමඟ පමණක් ඔවුන්ගේ ගනුදෙනු සිදුවනු ඇත.

තමන් වෙත එන ඕනෑ කෙනෙකුට මුනිවර අසපුව විවෘතය.



Scanned with CamScanner

## 16

## නොමැරෙන කෙනෙකු ලෙස ජීවත් වන්න එපා

ඔබගේ මනස සියලු ආකාර සිතුවිලිවලින් මුදවා හරින්න. සිත තුළ සාමය ඇති කරගන්න. ලෝක සත්වයන් දුක්විඳින දෙස බලන්න. ඔවුන් සැපවත් වනු ඇත යන ප්‍රාර්ථනය සිතෙහි ඇතිකරගන්න. ලොවෙහි උපන් සෑම සත්වයකුටම ලෝක ධර්මතාවන්ට යටත්වීමට සිදුවෙයි.

ලෝක ධර්මයට යටත්වීම යනු පැවැත්මට පෙර පැවති මූලික ස්වභාවය සමඟ එක්වීමයි.

ගැටලුවක මූලය දකින තුරු ඒ ගැටලුව ලිහීමට වෙර දැරීම නිෂ්ඵලය. ඔබ මෙහි පැමිණියේ කොහි සිටද යන්න සෙවීමට ඔබට අමතක වී ඇත. බාගෙවිට ඒ විෂය ඔබට රසවත් නොවනු ඇත.

සෑම කල්හිම මැරෙන බව දැන මරණයට සූදානම්ව දිවි ගෙවන්න. එවිට වීරයකු මෙන් මරණයට මුහුණ දීමට ඔබට හැකි වනු ඇත.

ආත්තම්මා කෙනෙකු මෙන් කාරුණික වන්න. රජකු මෙන් ගරු ගාම්භීර ලෙස දිවි ගෙවන්න.

## 17

## මිනිසුන්ට නොදැනෙන ලෙස ඔවුන් මෙහෙයවන්න

මුනිවරු ලොව පාලනය කරති. නමුත් ඒ මිනිසුන්ට නොදැනෙන ලෙසය. නිහඬ පැවැත්මෙන් මුනිවරුන්ගේ ගුණ බලය අනුමාන කළ හැකිය. මිනිසුන්ගේ ආදරයට



Scanned with CamScanner

භාජනය වන තරමෙන් පාලකයාගේ හොඳ නරක අනුමාන කළ හැකිය.

මිනිසුන් ඔබට බය නම් ඔබ හොඳ පාලකයකු නොවනු ඇත. මිනිසුන් ඔබට ගරහන්නේ නම් ඔබ නරකම පාලකයාය.

ඔබ මිනිසුන් විශ්වාස නොකරන තරමට ඔවුහුද ඔබ ගැන අවිශ්වාස කරති. ඔවුන් අවිශ්වාසවන්තයන් බවට පෙරළා දමනුයේ ඔබ විසින්මය.

කාර්ය ශූර පුද්ගලයා කතාවෙන් නොව ක්‍රියාවෙන් තම දස්කම ඔප්පු කරනු ඇත.

කාර්යය ඉටු කළ කල්හි "පුදුමෙනුත් පුදුමයි. අපි ඒ වැඩය කළා නෙව. අපේ එකමුතු කමෙන් ඒ වැඩේ සිදුකළා නේද?" යනුවෙන් මිනිසුන් කතාබහ වෙනු ඇත.

## 18

## තැනට අවශ්‍ය දෙය ඉදිරියෙන් තබන්න

භක්තිය සහ අවබෝධය එකට තිබිය නොහැකිය. අවබෝධය නොමැති කල්හි භක්තිය එතැන උදුරා ගනියි.

ප්‍රඥාව පසුබැස ගිය කල්හි දැනුම හා කාර්යශූරත්වය එතැන උදුරා ගනියි. පවුලේ සාමය නොමැති කල්හි ලොකුකම් පොඩිකම් මතු වන්නට පටන්ගනියි.

රටට ජාතියට උපද්‍රවයක් පැන නැගි කල්හි ජාති මාමකත්වය ඉස්මතුවීමට පටන් ගනියි. (When the country falls into chaos, patriotism is born.)


Scanned with CamScanner

## 19

## හොඳම පිළිවෙත මැදුම් පිළිවෙතයි

භක්තිය හා දැනුම හඳුන්වා දී නොමැති කල්හි මිනිස්සු අදට වඩා සිය ගුණයක් සතුටින් දිවි ගෙවූහ. යුක්තිය සදාචාරය විචාරා බැලීමක් නොමැති කල්හි මිනිස්සු අදට වඩා සාධාරණව දිවි ගෙවූහ.

කර්මාන්ත හා වෙළඳාම් නොමැති කල්හි මෙලොව කිසි සොරකමක් සිදු නොවීය.

ජීවිතය ජය ගැනීමට අවශ්‍ය නම් කිසිවක අන්තයට නොගොස් මධ්‍යම ප්‍රතිපදාව හුරු කරන්න. වෘත්තයේ මැදට වී (සම සිත්හි පිහිටා) පරිධිය මත සියල්ල (සිදුවිය යුතු අයුරු) සිදුවන හැටි බලා හිඳින්න.

## 20

## ජය හා පරාජය එකම කාසියේ පැති දෙකකි

ඔබේ සියලු ප්‍රශ්න එක මොහොතෙන් දුරු කර දැමීමට අවශ්‍යද? එසේ නම් සිතීම නවතන්න. ඇත හා නැත යන්න අතර පරතරය කුමක්ද? සාර්ථකත්වය හා අසාර්ථකවීම අතර පරතරය කුමක්ද?

ඔබ අනෙකාගේ ඉලක්ක පසුපස හඹා යන්නේ මන්ද? අනෙකාගේ රුචි අරුචිකම් මත ඔබ රැඳී සිටින්නේ මන්ද?

අහෝ...කෙතරම් හාස්‍යජනකද?

මිනිස්සු සිය ඉලක්ක පසුපස හැල්මේ හඹායති. ඔවුන්ගේ ගමන යුද සේනාංකයක ඉදිරි ගමන මෙනි.



Scanned with CamScanner

මම නිසලව මෙතැන සිටිමි. ඔවුන්ගේ ගමන ගැන මා වධ විය යුතු නැති බව පැහැදිලිය. මම ඒ ගැන ඔවුන්ට විස්තර කරන්න නොයමි. තවම හිනා වෙන්නට නොතේරෙන අලුත උපන් බිලිඳෙකු මෙනි.

සෙස්සෝ බොහෝ උද්‍යෝගිමත් වෙති. මම ගනඳුර මෙන් නිසලව හිඳිමි. සෙස්සෝ බොහෝ නිර්භීත වෙති.

මම බියාදුව නියාළුව සිටිමි.

සෙස්සන්ට ජීවිතයේ පෞද්ගලික ඉලක්ක ඇත.

මට නම් පෞද්ගලික ඉලක්ක කිසිත් නොමැත.

මම මුහුදු රළ මත ඒ මේ අත පෙණකැටියක් බඳු වෙමි.

මම සුළඟෙහි පාවී යන රොන් සුණුවක් බඳු වෙමි.

## 21

## සංකල්ප මැවීම රැවටීමේ මුලයි

මුනිවරු තාඕව අවබෝධ කරගෙන ඒ මත විශ්වාසය තබති. මුනිවරයාගේ දර්ශනය තාඕව මත පදනම් වූවකි. තාඕව කුමන ආකාරයක් ගනීද යත්? එය කිසිවකු විසින් හෝ ස්පර්ශ කරනු ලැබිය නොහැකිය. මුනිවරුන් තාඕව මත රඳා සිටිනුයේ කෙසේද?

මුනිවරුන් සංකල්ප මැවීමක් නොකරන බැවින් තාඕව මත රඳා සිටීම (ඉබේටම) සිදු වෙයි.

තාඕව පතුළ නොපෙනෙන අඳුරු ආගාධයකට සම කළ හැකිය. එසේනම් ඒ අඳුර තුළින් (ප්‍රඥාවේ) ආලෝකය දල්වනුයේ කෙසේද?

(දැල්වීමට) ඉඩහැරීමෙනි.



Scanned with CamScanner

තාඕව නම් බලවේගය කාලය හා අවකාශය බිහිවීමට පෙර සිටම පැවතුණි. එය ඇත හා නැත යන ස්වභාවයන් දෙකෙන්ම මිදුණකි. මා එය ප්‍රත්‍යක්‍ෂ කරගත්තේ කෙසේද කියතොත්? මම තාඕව තුළ කිමිදී ඒ සියල්ල (ප්‍රත්‍යක්‍ෂ වශයෙන්ම) අවබෝධ කරගතිමි.

## 22

## අපක්ෂපාතී වණ්ණ

ඔබට අපක්ෂපාතිව ජීවත් වීමට අවශ්‍ය නම් පළමුව පක්ෂපාත වී එහි අත්දැකීම (ඵලවිපාක) ලබන්න. ඔබට සාධාරණ පුද්ගලයකු වීමට අවශ්‍ය නම් අසාධාරණ ලෙස ජීවත් වී එහි අත්දැකීම (ඵලවිපාක) ලබන්න.

ඔබට පරිණත පුද්ගලයකු වීමට අවශ්‍ය නම් අසම්පූර්ණ පුද්ගලයකු ලෙස ජීවත් වී එහි අත්දැකීම (ඵලවිපාක) ලබන්න.

ඔබට නැවත ඉපදීමට අවශ්‍ය නම්, පළමුව මියැදීම හැර වෙන විකල්පයක් නැත. ඔබට සැම දෙයම නතු කර ගැනීමට අවශ්‍ය නම් සියල්ල අත්හැර හුදෙකලා වන්න.

තාඕව අවබෝධ කරගත් මුනිවරයා සියල්ලන්ට හොඳ පාඩමක් වන සේ ජීවත් වෙයි. ඔහු තමාගේ පුරාජේරුව නොකියන අතර ජනතාව ඔහුගේ චර්යාව දෙස බලා ඔහු කවුදැයි තක්සේරු කරනු ඇත. මුනිවරයාගේ වදන් පරම සත්‍ය වන බැවින් එහි ඔප්පු කිරීමක් අවශ්‍ය නොවේ.

ඔහු මමත්වය මුදා හල බැවින් මිනිස්සු ඔහු තුළ පරම සත්‍යය ඇති බව වටහා ගනිති. ඔහු කිසිදු බලාපොරොත්තුවක් නොමැතිව ක්‍රියා කරන බැවින් කරන හැම දෙය සාර්ථක වන බව නිගමනය කෙරෙයි.



Scanned with CamScanner

පුරාතනයේ වැඩ හුන් මුනිවරු මෙසේ දේශනා කළහ. "සියල්ල ලබා ගැනීමට අවශ්‍ය නම් පළමුව සියල්ල අතහැර දමන්න."

මේ මුනි වදන හිස් වදනක් නොවේ. සත්‍යාවබෝධයට එකම මඟ සියල්ල අතහැර තාඕව තුළ ජීවත් වීමයි.

## 23

## තාඕව යනු ස්වභාවිකත්වයේ රීති අවබෝධයයි

මිනිසුන්ට ඇවැසි සියලු උපදෙස් දෙන්න. ඉන් පසු නිශ්ශබ්දව සිටින්න. සියලු සොබාවික බලවේගයන්ගේ සිරිත එයයි. වැස්ස එක්වරක් හරියට තිබුණොත් ඇති වෙයි.

කුණාටුව එක් වරක් තිබුණොත් ඇති වෙයි. වලාකුළින් එක් වරක් මිදීම හිරු පායා ඒමට ප්‍රමාණවත් වෙයි.

ඔබ තාඕවට නැඹුරු වුවහොත්, ඒ සමඟ ඒකාත්ම වීම ඊළඟට සිදුවෙයි. තාඕව සමඟ ඒකාත්ම වූ පසු ඔබට ආධ්‍යාත්මික අවබෝධය නිරායාසයෙන්ම ලැබෙයි.

ඔබට තාඕවේ සියලු අර්ථයන් දැන ගැනීමට ඉඩ සැලසෙනු ඇත.

මම එය උදාහරණයකින් පහදමි. ඔබ සතු සියල්ල නැතිවුවහොත් ඔබ කිසිවක් නැති මිනිසෙකි. තාඕව අවබෝධයද ඒ හා සමාන කළ හැකි සංසිද්ධියකි.

තාඕව තුළට ඔබේ මනස විවර කරන්න. ස්වභාවධර්මයේ නීතිවලට ගරු කරන්න. එකල්හි සියලු දෙය නිවැරදි තැන්හි පිහිටනු ඇත.



CS Scanned with CamScanner

## 24

# හොඳන්නා පදවලට නැටීමෙන් වළකින්න

ඇඟිලි තුඩු මතින් සිටගත් මිනිසාගේ ඉරියව ස්ථාවර නොවේ. තරගය ආරම්භයේ අධිවේගයෙන් දුවන ධාවකයා වැඩි දුරක් නොදුවයි. පමණට වැඩි ආටෝපය වැඩි කලක් රඳා නොපවතියි.

තමන් ගැන පුරසාරම් කියන්නා තමන් කවුදැයි කියා නොදැන සිටින්නෙකි. අනුන් පාලනයට වෙහෙසෙන්නා තමන්ට තමන්වත් පාලනය කර ගැනීමට නොහැකි තැනැත්තෙකි.

පමණට වඩා වෙහෙසෙන්නා දිගු කලක් පවතින දෙයක් නොසාදන්නෙකි.

ඔබ තාඕවට අනුව ජීවත් වන්නේ නම්, ඔබේ කාරිය හරිහැටි කරන්න. වැඩි පද නොගසන්න. දන්නා පදය ගසන්න.

## 25

# සියල්ල තද නිහැඬියාවෙන් ඇරඹෙයි

විශ්වය බිහිවීමට පෙරාතුව හැඩයක් නොමැති එහෙත්, පරිපූර්ණ පදාර්ථයක් විය. සියල්ල හිස්ව පූර්ණ නිහැඬියාව තුළ ගිලී පැවතුනි. ස්ථාවරභාවය හා වෙනස් නොවනසුලු භාවය එහි පැවති ගුණාංගයන්ය. කොනක් නැති නිමක් නැති පූර්ණ ශුන්‍යතාවය එකල පැවතුණි. ඒ පරම ශුන්‍යතාව විශ්වයේ මව සේ සැලකිය හැකිය.



Scanned with CamScanner

ඊට නමක් නැත. ඊට නමක් නැති නමුත් හඳුනාගනු පිණිස තාඕව යන නම යෙදුණි.

මේ ලෝකය තුළ වඩාත්ම වටිනා දේ සතරකි.

තාඕව වඩාත්ම වටිනා දෙයයි. විශ්වය වටිනා දෙයකි. විශ්වය තුළ පෘථිවිය වටිනා තැනකි. පෘථිවිය මත මිනිසා වටිනා ජීවියෙකි. දැන් අපි ආපස්සට සිතමු.

මිනිසා පෘථිවියේ නීතියට යටත්ය. පෘථිවිය විශ්වයේ නීතියට යටත්ය. විශ්වය තාඕවට යටත්ය. තාඕව යටත් කාටද? ඇය කිසිවකුට යටත් නැත.

## 26

## පමණට වැඩි බලාපොරොත්තුව සියල්ල අහිමි කර දමයි

බර දේ ගැන කතා කරන්නට සිදුවන්නේ සැහැල්ලු දෙයට සාපේක්ෂවය. චලනය ගැන කතා කරන්නට සිදුවන්නේ නිශ්චල දෙයට සාපේක්ෂකවය.

මුනිවරු සිය අසපුවට වී ලොව සියලු දෙය චිත්ත බලයෙන් ග්‍රහණය කර ගනිති. කවර දෙයකින් වුවද මුනිවරයාගේ සන්සුන්කම බිඳිය හැකි නොවේ.

රජවරුන් අඥානයන් සේ යුද වදින්නේ මන්ද? පමණට වඩා දුර බලය පැතිරවීමෙන් ළඟ ඇති බලයත් නැතිව යයි.

පමණට වැඩි මහන්සියෙන් ලබා ගත හැකිව තිබූ ප්‍රතිඵලයද අහිමිව යයි.



CS Scanned with CamScanner

## 27

# සෑම දෙයක්ම කල්තබා තීරණය නොකරන්න

හොඳ සංචාරකයාට කලින් කළ සැලසුමක් නොමැත. කලින් සැලසුම් කළ ගමනාන්තයක්ද ඔහුට නැත. දක්ෂ සිත්තරා කැන්වසය මත අඳින සිතුවම බලහත්කාරයෙන් තොරව නිර්මාණය වනු ඇත.

දක්ෂ විද්‍යාඥයාද එබඳු පුද්ගලයෙකි. ඔහු කල්තබා තීරණ වෙත නොපැමිණෙයි. හේ තමන්ට ලැබීමට ඉඩ ඇති කවර හෝ ප්‍රතිඵලයක් දැකීමට සූදානමින් පරීක්ෂණය කරගෙන යයි.

මුනිවරු සියලු ජනයාට සිය අසපු විවෘතව තබති. මුනිවරු කිසිවකු හෝ ප්‍රතික්ෂේප නොකරති. ඔහු ඕනෑම ප්‍රතිඵලයකට සූදානමින් කල් ගෙවන්නෙකි.

මෙයාකාර ජීවිතයක් "ප්‍රඥාවේ ආලෝකය තුළ දිවි ගෙවීම" ලෙස විස්තර කළ හැකිය.

හොඳ ගුරුවරයකුගෙන් නරක ගෝලයකු බිහිවිය හැකිය. නමුත් එහි අනිත් පැත්ත විය නොහැකිය. නරක කෙනෙකු හොඳක් කළ හැකිය. එනමුත් හොඳ කෙනෙකුන් අතින් නරකක් විය නොහැකිය.

ඔබ මේ කියන දේ අවබෝධ කර නොගත්තොත් ජීවිතයම අඳුරට තල්ලු වී යා හැකිය. වඩාත්ම දුෂ්කර කාරිය වනුයේ ඔබ කෙතෙක් ප්‍රඥාවන්තද යන්න ඔබ විසින්ම තේරුම් ගැනීමයි.



Scanned with CamScanner

## 28

## එරෙහි නොවීමේ බලය (වූ වයි)

ඔබ පිරිමියකු නම් පිරිමියකු වන්න. එනමුත් ගැහැනියක මෙන් මෘදු වන්න. මුළු ලොවම ඔබ සතු වුවත් කිසිවක් නැත්තකු මෙන් දිවි ගෙවන්න. කුඩා දරුවකු මෙන් සරලව දිවි ගෙවන්න. තාඕව සදාකල් ඔබ ළඟම සිටිනු ඇත.

ආලෝකය ඇඳින ගන්න. අඳුරෙහි දිවි ගෙවන්න. ලෝකය තේරුම් ගන්න. ලෝකයට ආදර්ශයක් වන්න. එකල්හි තාඕව ඔබ තුළම පවතිනු ඇත. කළ නොහැකි කිසිත් නොමැති බව අවබෝධ වනු ඇත. මිනිසුන් අතර වෙනස්කම් හැඳිනගන්න. වෙනස නුදුටු ලෙස හැසිරෙන්න. ලෝකය ඔබට වෙන්කර ඇති ස්ථානයෙහි වෙනසක් නොමැතිව හිඳින්න.

ලෝක ධර්මයට ප්‍රතිවිරුද්ධ නොවන තරමට තාඕව ඔබ තුළ බැබළෙනු ඇත. සියල්ලේ මූලික ස්වරූපය වෙත හැරීම තාඕව සමඟ ජීවත් වීමේ හරයයි.

වචනය ශබ්දවලින් තැනුණි. ආයුධ ආම්පන්න ලීවලින් තැනුණි. මුනිවරයා භාවිතය දනියි. එහෙත්, ඔහු භාවිතයෙන් ඉවත් වී සියල්ලේ මූලික ස්වභාවය වැලඳ ගනී. එනයින් ඔහු සියල්ල භාවිතයේ යෙදෙයි.

## 29

## ලෝකය වෙනස් කිරීමට යාම ලෝක විනාශයේ මුල වෙයි

ඔබට ලෝකය දියුණු වනු දැකීමට අවශ්‍යද? මා හිතන්නේ එය කළ නොහැකි බවයි. ලෝකය මිනිසාගේ පරිකල්පන ශක්තියෙන් එහා ගිය නිමැවුමකි. එය තවකෙකු



CS Scanned with CamScanner

විසින් දියුණු කළ නොහැකිය. ඔබ ලෝකය දියුණු කිරීමට ප්‍රයත්න දරන වාරයක් පාසා ලෝකය විනාශ මුඛයට යයි. ලෝකය යනු පරිභෝග කරන වස්තුවක්ය යන්න සිතන තරමට ලෝක විනාශය ඔබ ළඟට පැමිණෙයි.

ඉදිරියෙන් යාම කාලය මත තීරණය වන්නකි.
පසු බැසීම කාලය මත තීරණය වන්නකි.
ගමන් කිරීම කාලය මත තීරණය වන්නකි.
විවේකය කාලය මත තීරණය වන්නකි.
උනන්දුව කාලය මත තීරණය වන්නකි.
හතිවැටීම කාලය මත තීරණය වන්නකි.
ආරක්ෂිත බඹව කාලය මත තීරණය වන්නකි.
අනතුරෙහි වැටීම කාලය මත තීරණය වන්නකි.

මුනිවරයා සෑම දෙයකම යථා ස්වරූපය මනසින් ග්‍රහණය කර ගනියි. ඔහු කිසි දෙයක් තම පාලනයට යටත් කර ගැනීමට නොවෙහෙසෙයි.

"සියල්ල පුරුදු විදියට සිදුවුණා දෙන්.
මම මෙතැනම නැවතී බලා සිටින්නෙමි."

## 30

## කළ කළ දේ පල පල දේ

තාඕව අනුව පාලනය කරන කෙනෙකු විසින් මිනිසුන් බලහත්කාරයෙන් හැසිරවීමට නොයා යුතුය. අවි බලෙන් සතුරන් නැසීමට නොයා යුතුය. සෑම බලයකටම එරෙහිව ක්‍රියාත්මක වන ප්‍රතිවිරුද්ධ බලයක් ඇත. ඔබ යමෙකුට අනතුරක් කරන්නේද එවැනි අනතුරක් ඔබට සිදුවන්නේය යන්න ලෝක ධර්මතාවකි. නැණවත් සත්පුරුෂයා සිය කැමැත්තෙන් ලෝකාර්ථචරියාවෙහි යෙදෙයි. එහෙත් ඔහු



CS Scanned with CamScanner

එක්තරා දිනක එයත් නවත්වයි. මන්දයත් ඔහුට එක්තරා ඥානයක් පහළ වන බැවිනි. විශ්වීය බලවේග සදාකල්හි අපේ පාලනයෙන් තොරව ක්‍රියාත්මක වීය යන්න ඒ අවබෝධතා ඥානයයි.

සිය මෙහෙයවීමෙන් කරන සෑම වෙනස්කමක්ම විශ්ව ධර්මතාවයට එරෙහිව ක්‍රියාත්මක වීමකි.

තාඕව අවබෝධ කරගත් පළියට එය අනුන්ට ඉගැන්වීමට මහන්සිවීමේ යුතුකමක්ද නැත. තාඕව දන්නා තැනැත්තා අනුන්ගේ උපදෙස් නැතිව ස්වයංභූත ඥානයෙන් සිය ක්‍රියාවන් සිදු කරයි.

ඔහු තම ක්‍රියාවන්ගේ නිවැරදිබව දන්නා බැවින් අනුන් විමසා සැක හැර ගැනීමක්ද සිදු නොවේ.

තම තීරණ මතම යැපෙන බැවින් ඔහු අවශේෂ ලෝකයාගේ ගරු නම්බුවලට පාත්‍ර වෙයි.

## 31

## අවිගත්තෝ අවියෙන්ම නසිති

නුවණැතියෝ අවිආයුධ භාවිතය අතිශයින් පිළිකුල් කරති. තමන්ගේ ආත්මාරක්‍ෂාවට හැර ආයුධ භාවිත කරන්නා අඥානයෙකි. ආයුධ භාවිතයේදී හැකිතාක් අඩුවෙන් හානි කරන්න. ලොව වටිනාම දෙය රටවල් අතර සාමයයි. සාමය නොමැති කල සතුටක් කොයින්ද?

මිනිස් වර්ගයාගේ ප්‍රබලතම සතුරන් වනුයේ යකුන් රාක්‍ෂයන් නොව මිනිසුන්මය. මිනිසුන්ගේ දිවි තොරකර ලබාගන්නා ජයක් සැබෑ ජයක් වනුයේ කෙලෙසද? මිනිසුන් සතුටින් තැබීම සැබෑම ජයග්‍රහණය වන්නේය.



Scanned with CamScanner

"යනු කැමති නම් සංග්‍රාම භූමියට
සැරසෙනු මළ ගෙයක යන විලසින
බැරි නම් වළකනු කුරිරු යුදගැටුම්
සටන් වදිනු මානව දයාවෙන්"

## 32

## සියලු දෙය නැසෙනසුලුය

තාඕව ඉන්ද්‍රිය ගෝචර නොවේ. එය කුඩාම අංශුවටත් වඩා පොඩිය. නමුත් එය තුළ සක්වළ සියලු දෙය ඇතුළු කළ හැකිය. බලය ඇති අය තාඕව අනුව ජීවත් වුවහොත් ලෝකය අදට වඩා සුන්දර තැනක් වනු ඇත. එකල්හි සියලු දෙය නිසි තැන්හි පිහිටනු ඇත.

පාලකයන් තාඕව අනුව රට පාලනය කරන විට පාරාදීසයක් බිහිවනු නියතය. සියල්ලන්ම සතුටින් සිටිනු ඇත. නීතිය පොත්වල නොව, මිනිසුන්ගේ හදවත්වල ලියැවෙනු ඇත.

සියලු ආකාර නිමැවුම් කිසියම් කොන්දේසිවලට යට වෙයි. සියලු ආකාර ආකාර ආරම්භ කිරීම් අවසානයකට මඟ පාදා දෙයි. කාරිය ඉටුකර අවසන් වූ කල්හි සියල්ලන්ට නික්ම යාමට සිදුවනු ඇත.

ඔබට අවදානමෙන් මිදීමට අවශ්‍යද? එසේ නම් නැවතිය යුතු තැන හඳුනා ගන්න. සියල්ල අවසන් වනුයේද තාඕව තුළ ගිලී යාමෙනි.

සියලු ගංගා මුහුදට ගිලා බසින්නාක් සේම ඇතිවන සියල්ල තාඕව තුළ සමාප්තියට පත්වෙයි.



Scanned with CamScanner

## 33

## තමන් ජය ගැනීම සැබෑ ජයග්‍රහණයයි

අනුන් ගැන දැනගැනීම බුද්ධියේ ලක්‍ෂණයකි. තමන් ගැන දැන ගැනීම ප්‍රඥාවේ ලක්‍ෂණයකි. අනුන් ජය ගැනීමේ හැකියාව ශක්තිය නම් වෙයි. තමන් ජය ගැනීම සැබෑම බලය වෙයි.

මට දැන් ඇති යන හැඟීම ඇතිවන තුරු කිසිවකු නියම ධනවතකු බවට පත්නොවෙයි. මධ්‍යම ප්‍රතිපදාවට පැමිණෙන තුරු පරාජයේ අන්තරාය පහ නොවෙයි.

## 34

## තාඕව සෑම තැනකම පවතින්නකි

සියලු දෙය බිහිවූයේද ලෝකය හටගත්තේද තාඕවෙනි. එනමුත් තාඕව විසින් කිසිවක් බිහිකළේද නැත. තාඕවෙහි කාර්යය නම් බිහිවීමට සැලැස්වීමයි. සිදුවීමට සැලැස්වීමයි. එනමුදු තාඕව විසින් කිසිවක් ආපිට බලාපොරොත්තු වීමක් නැත. අපරිමිත ලෝක ධාතු සංඛ්‍යාවක් තාඕවේ බලයෙන් බිහිවිය. එනමුත් තාඕව ලෝකධාතු මත බරක් නොවෙයි. තාඕව සියල්ල තුළ ගිලී පවතින්නකි. සියලු සත්වයන්ගේ හද මඩල තුළ තාඕව එලෙසින්ම සැඟව පවතියි.

තාඕව එක්තරා විදියක නිරහංකාර බලවේගයකි. සියල්ල ඒ තුළ ගිලී යයි. එහෙත් තාඕව ඒ සියල්ල භාරගනියි. තාඕව තුළ කෙතෙක් උසස් ගුණ තිබුණද තාඕව තමන් ගැන නොදනියි. තාඕවේ වඩාත්ම පුදුම ගුණාංගයද එයයි.



CS Scanned with CamScanner

## 35

## සියලු ජයග්‍රහණයන්ට පදනම ස්වභාවිකත්වයේ රහස් දැන ගැනීමයි

තාඕව තුළ ජීවත් වන්නකුට ලොව කොතැනක වුව සාමකාමී ලෙස ජීවත් විය හැකිය. ලොකු මහන්සියකින් පසුව නමුත් තාඕවාදියාට සියලු විෂමතා ජයගත හැකිය.

හදවතේ අභ්‍යන්තර සාමය සියලු ජයග්‍රහණයන්හි පදනම වෙයි. සංගීතය හා රස ආහාර සුවඳ මිනිසුන්ගේ අවධානය දිනා ගැනීමට සමත් කරුණු දෙකකි. එනමුත් තාඕවට රහස් නැත. හැඩයක්ද ඊට නැත.

ඔබ තාඕව දකින්නට උත්සාහ කළද එය දැකිය හැකි දෙයක් නොවේ. ඔබ තාඕවට කන්දෙන්නට උත්සාහ කළද තාඕව හඬක්ද නොවේ. එනමුත් ඔබ තාඕව ක්‍රියාවේ යෙදවීම ඇරඹුවොත් එහි ක්‍රියාකාරිත්වයද අවසන් නොවේ.

## 36

## උඩඟුකම විනාශයට මුලය

ඔබට යමක් මිරිකීමට අවශ්‍යද? එසේ නම් ඒ දෙයට පිම්බීමට ඉඩ හැරිය යුතුය.

ඔබට යමක් වනසා දමන්නට අවශ්‍යද? එසේ නම් ඒ දෙය පමණට වැඩි වේගයෙන් වැඩීමට ඉඩ හළ යුතුය.

ඔබට යම් උදව්වක් අවශ්‍යද? එසේ නම් පළමුව අනුන්ට උදව් කිරීමට හුරු විය යුතුය.



Scanned with CamScanner

මේ කියන උපක්‍රමයට විශේෂ නමක් ඇත. ලෝක ස්වභාවයට අනුගත වී ප්‍රතිලාභ ලැබීම යන නම ඊට යෙදෙයි.

මෘදුබවෙන් රළු බව දිනිය හැකිය. ප්‍රවේසමෙන් වේගය පැරදවිය හැකිය. ඔබ කරන දෙය පිටතට නොපෙන්වා ප්‍රතිඵලය පමණක් පෙනෙන්නට ඉඩ හරින්න.

## 37

## ලෝක සාමයට ඇති තර්ජනය බලකාමයයි

තාඕව විසින් කිසිවක් බලෙන් සිදු කරන්නේ නැත. සියල්ල ස්වභාවිකත්වයේ රීතීන්ට අනුගතව සිදුවෙයි. බලයෙහි සිටින්නන් තාඕව දැන අවබෝධ කළොත් ලොව තුළ ඇති උස්මිටිකම් එකල්හි අතුරුදන් වනු ඇත. සියලු දෙන සතුටින් දිවිගෙවනු ඇත. සියලු ගැටුම් සමනයට පත්වනු ඇත. සියලු ආකාර බලකාමය එයින්ම අවසන් වනු ඇත.

බලකාමය නම් වූ රෝගය සුවපත් වූ කල්හි ලෝක සාමය උදාවනු ඇත.

## 38

## ස්වභාවිකත්වයට එරෙහි ලෝක සම්මතයන් අවුල්වලට හේතුවයි

මුනිවරු කිසි දින කාය බලය කෙරෙහි විශ්වාසය නොතබති. එබැවින් ඔවුහු සැමකල්හි ශක්තිමත් වෙති. පුහුදුන් මිනිස්සු බලය වෙනුවෙන් පොරකති. ඔවුහු කිසිදින එයින් සෑහීමට පත් නොවෙති.



Scanned with CamScanner

මුනිවරු කිසිත් නොකරති. එනමුත් කිසිවක් නොකර තැබීමටද ඉඩ නොහරිති. පුහුදුන් මිනිසුන් කෙතෙක් වැඩ කළද තවත් කිරීමට වැඩ ඉතිරිව ඇති බැවින් ඒවා අවසන් නොවේ. කාරුණික මිනිසෙකුට වැඩක් බාරදුන් කල එහි යම් කොටසක් ඉතිරිව තිබීමට ඉඩ ඇත.

යුක්තිගරුක කෙනෙකුට වැඩක් කිරීමට බාරදුන් කල එහි බොහෝ කොටස් ඉතිරිව තිබීමට ඉඩ ඇත.

ආචාරශීලී කෙනෙකුට වැඩක් භාර දුනහොත් ඔහු පළමුව කමිසයේ අත් නවා ගනු ඇත. දෙවනුව වැඩට බසිනු ඇත. අවසන කිසිවකුගෙන් බැනුම් නාහන පරිදි කාර්යය නිම කරනු ඇත. ඔහු තම බලය උපරිම ලෙස කාර්යය වෙනුවෙන් යොදවනු ඇත.

තාඕව විද්‍යමාන නොවන කල්හි ඒ තැන ගැනීමට හොඳ හිත නම් වූ ගුණාංගයට සිදුවෙයි. හොඳහිත නම් ගුණාංගයද අවිද්‍යමාන වන කල්හි සදාචාරය ඒ හිස් තැන පුරවනු ඇත. සදාචාරයද නොමැති කල්හි චාරිත්‍රයන් එතැන ගනු ඇත.

ලෝක සම්මතය රඳා පවතිනුයේ හුදු අන්ධානුකරණය මතය. ලෝක සම්මතයට මුල්තැන දීම සියලු අවුල්වල මූලහේතුවයි.

මුනිවරු සැම විටම ගැඹුර මිස මතුපිට ගැන කල්පනා කරති. ඔවුහු ඵලය ගැන උනන්දු වී මුල අමතක කර දමති. මුනිවරුන්ට ආත්මලාභය පිණිස වූ එකම අරමුණක්වත් නොමැත. මුනිවරු සැමකල්හිම යථාර්ථය සමඟ උරෙනුර ගැටී දිවි ගෙවති. සියලු ආකාර අවිද්‍යාව විනිවිද දකින නුවණක් මුනිවරුනට ඇත.



Scanned with CamScanner

## 39

## උපන්නොත් මරණයට සූදානම් වන්න

තාඹුව සැම තැන්හිම ඇති බැවින් අහස හිස්ය. අනන්තයේ පැතිර පවතින්නේය. පොළව ඝනය. පරිපූර්ණය. සියලු සත්වයෝ ඒ මූල ස්වභාවයන් තුළින් පැන නගිති.

ඔවුහු තම ජීව කාලය ගෙවා දමා අලුත්වීමේ නීතියට ඉඩදෙමින් මිය පරලොව යති. මෙයාකාරයෙන් ලෝකය නොනැවතී අලුත් වෙයි.

මිනිසා තාඹුවට බාධා කරන කල්හි හිස් අහස කුණු කන්දල්වලින් පිරී යනු ඇත. පෘථිවි තලයේ සම්පත් හිඟවී යනු ඇත. ජීවයේ සමබරතාව බිඳී යනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පෘථිවිය ජීවයෙන් තොරවනු ඇත.

මුනිවරු කරුණා නෙතින් යුතුව ලොව දකිති. ඔවුහු සියල්ල සමස්තයක් ලෙස දකිති. ලෝකාර්ථචර්යාවෙන් කල් ගෙවති.

සැබෑ මුනිවරු ආභරණ දිළිසෙන්නාක් මෙන් කැපී පෙනෙන්නට වෙර නොදරති.

තාඹුවට ගැළපෙන සේ සරල ජීවිත ගත කරති. සරල හා රළු දිවිය ඔවුන්ට හොඳට හුරුපුරුදුය.



CS Scanned with CamScanner

## 40

## කරණ කලට පව් මීරිය මී සේ
## විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ

තාඕවේ කාර්යය ආපසු ගෙන ඒමයි. තාඕවේ මාර්ගය ක්‍රියාවෙහි ප්‍රතිඵල ගෙන දීමයි. ජීවිතය ජීවයෙන් උපදියි. ජීවත්වීම ජීවත් නොවීමෙන් උපදියි.

## 41

## ලෝකය තුළ වැඩිපුරම ඇත්තේ බොරු පුරාජේරුවයි

තාඕ මූලධර්මයන් ප්‍රඥාවන්තයකුට හමුවූ කල ඔහු වහා එය ග්‍රහණය කර ගනියි. සාමාන්‍ය බුද්ධිමට්ටමේ කෙනෙක් එය අඩක් පිළිගෙන අඩක් සැකයට බඳුන් කරයි. අඥානයකුට හමුවී නම් ඔහු එය අවඥාවට භාජනය කර ප්‍රතික්ෂේප කරයි.

"ඕකද තාඕව කියන්නේ?" යනුවෙන් කියන ඔහු සමච්චලයට සිනාසෙනු ඇත.

පුරාතණ පඬිවරුන් මෙසේද කියා ඇත. ආලෝකය වෙත ගමන අඳුර වෙත ගමන මෙන් පෙනෙන්නට ඉඩ ඇත. ඉදිරියට යන ගමන පසුපසට යාමක් ලෙස පෙනෙන්නට හැකිය. කෙළින් පාර දුර සේ පෙනෙන්නට හැකිය.

සැබෑ බලය දුබලතාවක් සේ පෙනෙන්නට හැකිය. සැබෑ පාරිශුද්ධභාවය අපිරිසිදු සේ පෙනෙන්නට හැකිය. ඍජුබව සැලෙනසුලුබව මෙන් පෙනෙන්නට හැකිය. පැහැදිලිබව අපැහැදිලි සේ පෙනෙන්නට හැකිය.



CS Scanned with CamScanner

අගනා කලා නිර්මාණයක් පමණට වඩා සරල සේ පෙනෙන්නට හැකිය. සැබෑ ආදරය නිහඬබවක් ලෙස පෙනෙන්නට හැකිය. සැබෑ ප්‍රඥාව ළාමක බව පෙනෙන්නට හැකිය.

තාඕව සොයාගෙන ගොස් ලබා ගන්නට බැරි දෙයකි. එය සියලු දේ තුළ සැඟවී සියල්ලට හිමි ගුණාංග ලබා දෙයි.

## 42

## සියල්ල නිර්මාණය කළේ තාඕව මගිනි

එක සැදුණේ තාඕවෙනි.

එකයි එකයි දෙක වෙයි.

දෙක සැදුණේ තාඕවෙනි.

තුන සැදුණේ තාඕවෙනි.

කෙටියෙන් පැවසුවොත් සියල්ල උපත ලද්දේ තාඕවෙනි. ස්ත්‍රීභාවය හා පුරුෂභාවය එකක් අනෙකට සාපේක්ෂක වෙයි.

ජීවිතයේ සාර්ථකත්වය ලැබීමට නම් ස්ත්‍රිය හා පුරුෂයා යන බලවේග දෙක එකට එක්විය යුතුය.

පුහුදුන් මිනිස්සු නිහැඬියාවට කැමති නොවෙති. එනමුත් මුනිවරු නිහැඬියාව ප්‍රිය කරති.

නිසල පරිසරයට යන හේ සිත නිසල කර විශ්වය සමඟ ඒකාත්ම වෙයි.



Scanned with CamScanner

43

## මුදුබවින් රළු බව ග්‍රක්මවන්න

පුදුම දෙය නම් මෘදු දෙයින් රළු දෙය යටපත් කිරීමයි. එමෙන්ම ඉතා කුඩා දෙය ලොකු දෙයට වඩා පහසුවෙන් හැසිරවිය හැකිය.

මෙම තාඕව ප්‍රතික්‍රියා නොදැක්වීමේ බලය නම් වෙයි.

වචන රහිත ඉගැන්වීම්ද, ක්‍රියාත්මක නොවී ප්‍රතිඵල ලැබීමත් මුනිවරුන්ගේ ප්‍රඥාවේ මහිමය ඔප්පු කර පෙන්වයි.

44

## සතුට රැඳී ඇත්තේ මුදල් මත නොවේ

ප්‍රසිද්ධිය හා ස්ථරවරභාවය - මේ දෙකෙන් කුමක් වඩා වටීද? මුදල හා සතුට - මේ දෙකෙන් කුමක් වඩා වටීද? ජය හෝ පරාජය - මේ දෙනෙක් කුමක් විනාශකාරී වේද?

අනෙකා මත යැපෙන තුරු ඔබ පිරිපුන් මිනිසකු බවට පත් නොවේ. මුදල මත සතුට ඇතැයි සිතන අයකු කිසිදා සැනසීමට පත් නොවේ.

ඔබ ලද දෙයින් සෑහීමට පත් වන්න. ලැබෙන දේ ඒ හැටියට බාර ගන්න. ලද දෙයින් සෑහීමට පත්වූ දින මුළු ලොව ඔබේ යැයි අවබෝධ වනු ඇත.



Scanned with CamScanner

## 45

## පුහුදුන් මිනිසුන් හට, සැබෑ ජයග්‍රහණය පරාජයක් ලෙස පෙණෙනු ඇත

සැබෑ පරිපූර්ණත්වය හිස් බවක් ලෙස පෙනෙනු ඇත. නියම ඍජුභාවය වංකකම ලෙස පෙනිය හැකිය. සැබෑ ඥානය අඥානකම ලෙස පෙනිය හැකිය. සැබෑ කලාව විකාරයක් ලෙස පෙනිය හැකිය.

මුනිවරයා සියල්ල එයාකාරයෙන් සිදුවීමට ඉඩ හරියි. එනමුත් සිදුවන දේ කුමක්ද යන්න හේ කල්තබා දැන සිටියි. ඔහු මාර්ගයෙන් ඉවතට වී තාඕ විසින් සියල්ල විසඳනු අයුරා බලා සිටියි.

## 46

## ලොකුම බාධාව අනියත බියයි

කිසියම් රටක් තාඕව අනුව පාලනය වන්නේ නම් කම්හල්වල ප්‍රයෝජවත් දේ තැනෙනු ඇත. කිසියම් රටක් තාඕවට එරෙහිව ප්‍රතිවිරුද්ධ ලෙස පාලනය කෙරෙන්නේ නම් කම්හල්වල විනාශකාරී අවි ආයුධ නිපදවෙනු ඇත.

ලෝකයේ ඇති ලොකුම මායාව බියයි. සටන් කිරීම තරම් වරදක් ලොව නැත. සතුරකු සමග ආරවුලක් පටලවා ගැනීම තරම් අවාසනාවක් ලොව නැත.

බය යන වැරදි ආකල්පයෙන් සිත මුදවාගත් දිනක මුළු ලෝකය ඔබට සුවදායී නවාතැන්පොළක් වනු ඇත.



Scanned with CamScanner

## 47

## සත්‍යය ඇත්තේ ඔබ අසලමය

නිවසේ දොරගුළු හැරීමෙන් තොරව වුව ඔබ හද මඬලේ දොරගුළු විවර කළ හැකිය. ඇත අන්තය දැකීමෙන් තොරව වුව තාඕව යන්න ඔබ විසින් වටහා ගත හැකිය. ඔබ වැඩි වැඩියෙන් අධ්‍යාපනය ලබන තරමට නොදන්නා දෙයද වැඩිවනු ඇත.

මුනිවරු නික්මීමෙන් තොරව පැමිණෙති. ආලෝකය නොමැතිව ලොව විනිවිද දකිති. ක්‍රියාවෙන් තොරව ප්‍රතිඵල ලබති.

## 48

## යථාවබෝධය ඇතිවන්නේ සියලු දැනුම මුදාහැරීමෙනි

දැනුම සොයා යන්නා දිනෙන් දින කුමක් හෝ අලුතින් දැන ගනියි. තාඕව සොයා යාමේදී එහි අනිත් පැත්ත සිදුවෙයි. දිනෙන් දින කුමක් හෝ දෙයක් අතහැරීමට සිදු වෙයි. දිනෙන් දින ටිකෙන් ටික ආශාවන් අත්හැරීමට සිදු වෙයි.

අවසන ඔබ කිසිවක් නොකරන තත්වයට පත්වෙයි.

කිසිවක් නොකරන තත්වය කිසිවක් කිරීමට නැති බැවින් ඇති වන ප්‍රතිඵලයකි.

සැබෑ මුනිවරයකු බවට පත්වීම යනු සියල්ල එපරිදි සිදුවීමට ඉඩ හැරීමයි. ලෝක ධර්මයට බාධා කිරීමෙන් මුනිවරයකු බවට පත්වීමට ඉඩ නැත.



Scanned with CamScanner

## 49

## ප්‍රදූෂණ්ටත් උදව් කරන්න

මුනිවරුන්ගේ මනසෙහි මමත්වය යන සංකල්පය ඉතිරිව නැත. ඔවුහු ලෝක සත්වයාගේ මනසෙහි ස්වභාවය දැන ඒ අනුව ක්‍රියා කරති. ඔවුහු හොඳ පුද්ගලයන්ට උදව් කරති. නරක පුද්ගලයන්ටද වෙනසක් නැතිව උදව් කරති. සැබෑ මනුෂ්‍යත්වය එයයි.

මුනිවරු විශ්වාසනීය පුද්ගලයන්ව විශ්වාස කරති. ඔවුහු අවිශ්වාස පුද්ගලයන්ද විශ්වාස කරති. සැබෑ විශ්වාසය යනු එයයි.

මුනිවරයාගේ මනස හිස් අහස වැනිය. පුහුදුන් මනසට මුනිවරුන්ගේ මානසික ස්වභාවය දත නොහැකිය. ඔවුහු මුනිවරයා ළඟ මොහොතක් නැවතී බලා සමුගෙන යති.

## 50

## නිතර මරණය සිහි කරන්න

සියල්ල අතහැරි බැවින් මුනිවරයා පුහුදුන් ජනයාගෙන් වෙනස් වෙයි. හේ ගත වනසෑම මොහොතකදීම මරණානුස්සතියෙන් කල් ගෙවයි. හේ ලැබෙන දුක් සැප මැදහත් සිතෙන් ඉවසයි. ඔහු විසින් තව කළ යුතු කිසිත් නැත.

කිසිදු තෘෂ්ණාවක්ද ඉතිරි වී නැත. මනසේ කිසිදු ක්ලේශයක්ද ඉතිරිව නැත. ශරීරය ගැන කිසිදු ඇල්මක්ද නැත.



CS Scanned with CamScanner

මුනිවරු තමන් කරන දෙය ගැන කල්තබා සැලසුම් නොකරති. ඔහුගේ තීරණ සියල්ල තාඕව තුළින් ඉබේ නැග එයි.

මුනිවරයාගේ මරණින් මතු නැවත හටගැන්මක් නැත. ඔහු එළඹෙන කුමන මොහොතක වුවද මරණයට සූදානමින් සිටියි.

මිනිසකු දිවා කල වෙහෙස වී රාත්‍රියේ නිදියහනට යාමට සූදානමින් සිටින්නාක් සේ මුනිවරයා මරණයට සූදානමින් දිවිගෙවයි.

## 51

## ලොව ඇති සියලු දෙය තාඕවේ රීතිවලට අනුකූලව නිර්මාණය වී ඇත

මිනිසා බිහිවන විට නිදහස් නිරහංකාර සත්වයෙකි. අත්දැකීම් තුළින් ඔහුගේ පෞරුෂය ඇති වෙයි. සියලු සත්වයන් තාඕව තුළින් බිහිවූ බැවින් තාඕවට ගෞරවයක් ඇති කරගත යුතුය.

සියලු සත්වයන්ට උපත ලැබීමට සැලැස්වීම, ඔවුන්ගේ වර්ධනය, සුවපහසුව, ආරක්ෂාව මෙන්ද මරණයද සිදුවන්නේ තාඕ රීතිවලට අනුකූලවය.

තාඕව සියල්ල නිර්මාණයට ඉඩ සලසන මුත් එය වෙනුවෙන් කිසිවක් ඉතිරි කර නොගනියි. මතු බලාපොරොත්තු නැතිව බිහි කිරීමට ඉඩ සලස්වයි.

බාධා නොකර මඟ පෙන්වයි. ස්වභාවධර්මයේ සියල්ල සිදු වනුයේ මෙකී තාඕ රීතීන්ට යටත්වය.



CS Scanned with CamScanner

## 52

## හැඟීම්වලට වහල් නොවන්න

සියල්ල ඇතිවීමට පෙර තාඕව පැවතුණි. සියල්ල බිහිවූයේද තාඕව ඇසුරෙනි. සියල්ල නැසුණු පසුවද තාඕව පවතිනු ඇත. සියලු දේ ආපස්සට ගමන් කළහොත් තාඕව අසල සියල්ල අවසන් වනු ඇත.

දෙමාපිය දරු ආදීන් බිහිව පැවතී නැසී යාම අවබෝධ කළ කල්හි මරණය ගැන දුකක් ඉතිරි නොවනු ඇත. තීරණයකට එළඹීමට නොහැකිකම හා ආශාවන් පසුපස ලුහුබැඳීම යන හේතු නිසා පුහුදුන් සිත නිරතුරු පීඩාවට පත්වෙයි. හැඟීම් පසුපස ලුහුබැඳයාම නවතන ලද දින සිට චිත්ත විවේකය උදාවනු ඇත.

අවිද්‍යාවේ සනාන්ධකාරය විනිවිද දකින්න. සිත සවිමත් කරගන්න. ප්‍රකෘති සිතේ ආලෝකය දකින්න. සිත මූලික ස්වභාවයට ගෙන එන්න. එම මානසිකත්වය ළඟා කර ගැනීම අනන්තයට ලඟා වීම නම් වෙයි.

## 53

## ධනපතියන්ගේ සැපත දුප්පතුන්ට දුක පිණිස හේතුවෙයි

මැදුම් පිළිවෙත පුහුණු කිරීම පහසුය. එනමුත් පුහුදුන් මිනිස්සු අන්තවාදීව කටයුතු කරති. සියල්ල සමබරව තබා ගන්න.

සමබර නොවූ දෙය ගැටලුවකට මඟ පාදනු ඇත. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම ජීවිතය දිනන මාවතයි.



Scanned with CamScanner

ධනවතුන් දේපළ කොල්ල කන විට දුප්පත් ගොවියෝ තව තවත් දුකට පත්වෙති. රජය යුද ශක්තිය වැඩි කරන විට එහි වන්දි ගෙවන්නට වන්නේ මහජනතාවටය.

ධනපති පන්තිය පමණට වඩා බැබළෙන කල්හි දුප්පතුන්ට පිළිසරණක් නොමැතිව යනු ඇත.

තාඕවට අනුව රට පාලනය නොකරන විට අවුල් ජාලයක් බිහිවී සොරකම රජයන්නට පටන් ගනියි.

54

## එදිනෙදා ජීවිතයට තාඕව එක් කරගන්න

යමෙක් තාඕව තුළ පැළවුණොත් ඔහු කිසි දින තවකෙකු විසින් උදුරා දැමිය නොහැකිය. යමකු තාඕව වැළඳගතහොත් ඔහු කිසිදින ඉන් ලිස්සා නොයනු ඇත.

මිනිසුන් තාඕව අනුව ජීවත් වන්නට පටන්ගත් විට තාඕ මූලධර්මයන් ඉදිරි පරම්පරාවන් දක්වා සුරැකෙනු ඇත.

ඔබ තුළ තාඕව පැළපදියම් කරගන්න. එතැන් පටන් ඔබ සැබෑ මිනිසකු වනු ඇත. පවුල තුළ තාඕ මූලධර්ම අනුගමනය කළොත් ඉතා ඉක්මනින් දියුණුව අත්වනු ඇත.

රටක් තුළ තාඕ මූලධර්ම අනුගමනය කළොත් අන් රටවලට උඩින් වෙසෙසින්ම කැපී පෙනෙනු ඇත. සක්වළ තුළ තාඕ මූලධර්ම අනුගමනය කළහොත් මුළු සක්වළම ප්‍රීතියෙන් නින්නාද වනු ඇත.

මා ඒ දේ හෙළි කරන්නේ කෙසේද?

මා විසින්ම ලබාගත් අන්තර්ඥානයෙනි.



CS Scanned with CamScanner

## 55

## මෘදුබව සැබෑ ජීව ගුණයයි

තාඹවට අනුව ජීවත්වන අයකු අලුත උපන් බිලිඳෙකුට සමකළ හැකිය. අලුත උපන් බිලිඳාගේ අස්ථීන් දුර්වලය. ශරීරය මෘදුය. එහෙත්, ඔහුගේ අල්ලා ගැනීම ශක්තිමත්ය.

අලුත උපන් බිලිඳා තමා දෙමාපිය සමාගමයෙන් උපන් බව නොදනියි. හේ තමා අනාගතයේ ශක්තිමත් මිනිසකු වන්නේය යන්න කල්පනා නොකරයි. ඔහු මුළු දවස කෑගසමින් සිටියද සැවොම ඔහුට නොමසුරුව ආදරය කරති. මුනිවරයාගේ බලයද අලුත උපන් බිලිඳකුගේ හැකියාව වැනිය.

## 56

## තාඹව අමතක කළද එහි බලය නැති නොවේ

පමණට වැඩි කතාවට යන්නෝ කිසිදු දෙයක් හරිහැටි නොදනිති. යමක් හරියට දන්නා අය පමණට වඩා ඒ ගැන කතාවට නොයති.

නිශ්ශබ්දතාවට හුරුවන්න. පංචේන්ද්‍රියන්ගේ දොරටු සංවර කර ගන්න. සියලු බැඳීම් එකිනෙක ලිහා දමන්න. එකල්හි ඔබ සිත එහි මූලස්වභාවයේ තැන්පත් වනු ඇත.

තාඹව කිසිදිනක අවලංගු කළ නොහැකිය. නිග්‍රහයට පාත්‍ර කළ නොහැකිය. අත්හැර දැමිය නොහැකිය. තාඹවේ විස්මිත බලය එයයි.



Scanned with CamScanner

## 57

## නීති වැඩි කෙරෙන තරමට වැඩියෙන් වැරදි සිදුවෙයි

ඔබට සැබෑ නායකයකු වීමට අවැසි නම් පළමුව තාඕව හැඳිනගන්න. පූර්ව සැලසුම් අත්හරින්න. සියල්ල ස්වභාවිකව සිදු වන්නට හරින්න.

දඬුවම් දැඩි කරන තරමට මිනිසුන්ගේ දුෂ්ඨකම්ද ඉහළ යනු ඇත. අවි භාවිතය වැඩිවන තරමට මිනිසුන්ගේ ආරක්ෂාව අඩුවනු ඇත. නීතිරීති වැඩිවන තරමට නීති කඩකිරීම්ද වැඩිවනු ඇත.

එබැවින් මුනිවරු මෙසේ කියති.

නීතිය නැති දින ලෝකය සාමකාමී වනු ඇත. ආර්ථික සම්බාධක නැති දින මිනිසුන් සමෘද්ධිමත් වනු ඇත. ආගමික බලපෑම් නැති තරමට මිනිසුන් වඩා සන්සුන් වනු ඇත. වටිනා දේට ඇති ඇල්ම අඩුවන තරමට ලොව වටිනා දේ සුලබ වනු ඇත.

## 58

## මිනිසුන්ව සතුටින් තබන්න

රජවරුන්ගේ තාදී ගුණ වැඩිවන තරමට මිනිසුන්ගේ ගුණධර්මද වැඩිවෙයි. රටවැසියන් තළාපෙළා රාජ්‍යය කරන තරමට මිනිසුන්ගේ කෲරකම් කපටිකම්ද වැඩිවෙයි. පාලකයන්ගේ තෘෂ්ණාව වැඩිවන තරමට රටේ පරිහානිය එලෙසින්ම වැඩිවෙයි. රටවැසියන් දුප්පත්කමින් මුදවා ගැනීමද ඔවුන් සතුටින් තැබීමද රජයේ අරමුණ විය යුතුය.



CS Scanned with CamScanner

රටවැසියන්ට සදාචාරවත් වීමට ඉගැන්වීම දඬුවමෙන් ඔවුන් පාලනය කිරීමට වඩා යහපත්ය.

මුනිවරු ලද දෙයින් සතුටට පත්වෙති. අනුන් පාලනය කිරීමට නොයති. අනුන්ට ආදර්ශයක් වන ලෙස දිවි ගෙවති. ඍජුබව හා මෘදු ගුණය එකවිට පවත්වාගෙන යති. දක්ෂබව හා සරල බව එකවිට පවත්වාගෙන යති.

## 59

## පරිසරයට ගැළපෙන සේ ජීවත් වන්න

මැදුම් පිළිවෙත හා සමාන තවත් පිළිවෙතක් ලොව නැත. මැදුම් පිළිවෙත අනුගමනය කරන මිනිසා සිතුවිලි නම් යදමින් මිදුණෙකි. හේ හිස් අහස මෙන් ඉවසිලිවන්ත වූවෙකි.

කඳුවැටි හිරුරැස් ගස්වැල් සුළඟ - හිස් අහසට මේ සියල්ල බර නොවේ. සුළඟට වැනෙන ගසක් මෙන් ඔහු තුළ මෘදු ගුණය ඇත. සියල්ලෙන් වැඩ ගැනීමේ දක්ෂතාව ඔහුට ඇත. ඔහු පමණට වැඩි බලාපොරොත්තු නැති අයෙකි. ඔහුට කළ නොහැකි දෙයක්ද නැත. මවක සිය දරුවන්ට සලකන මෙන් මැදිහත් සිත ඇති අය අනුන්ට පිහිට වෙති.

## 60

## පමණට වඩා රජවීම විනාශය ගෙන දෙයි

රටක් කරවීම හාල්මැස්සන් බැදුමක් හැදීම මෙන් ඉවසිල්ලෙන් කළ යුතු ක්‍රියාවකි. පමණට වඩා තද පාලනයෙන් අයහපතක්ම අත් වෙයි.



Scanned with CamScanner

තාඹව අනුව රට පාලනය කළහොත් කිසි කලෙක සතුරන්ට ජය ලබනු නොහැකිය. කිසි කලෙක අනතුරක් නොමවීම මෙයින් අදහස් නොකරන අතර සටනට යවන් සෑම විටම ජය ලබන බව මින් අදහස් වෙයි.

ප්‍රතිප්‍රහාර එල්ල කළ නොහැකි තැනදී සතුරාට ප්‍රහාර එල්ල කරන්න. එයින්ම ඔහු පරාජයට පත්වනු ඇත.

## 61

## වරද පෙන්වා දුන් කල නිහතමානී වන්න

රාජ්‍යයක් පාලනය කළ යුත්තේ මහ මුහුද උපමාවට ගැනීමෙනි. සියලු ගංගා මුහුදට එක්ව සම බවට පත්වෙයි. බලගතු රාජ්‍යයේ පාලකයා සැමට සම සිතින් සැලකිය යුතුය. රාජ්‍යය බලගතු වන තරමට සම සිත පැතිරවීමද වඩ වඩාත් සාධාරණ විය යුත්තේය. මිනිසුන් කෙරෙහි සාධාරණ වන තරමට බලය යෙදීමේ අවශ්‍යතාවයද අඩු වෙයි.

බලගතු ජාතියක් බලගතු මිනිසකුට උපමා කළ හැකිය. හොඳ මිනිසා තමන්ගේ වරද එලෙසින්ම දකියි. ඔහු වරද පෙන්වා දුන් තැන්හි නිහතමානීව පිළිගනියි. එලෙස පිළිගෙන වරද නිවැරදි කරයි. තමන්ගේ වරද පෙන්වා දුන් අයට ප්‍රශංසා කර ගුරුතන්හි තබයි.

තමන්ගේ සතුරන් තමන්ගේම සෙවණැල්ල වැනිය යන අවබෝධයට පැමිණිය යුතුය.

රටක් තාඹව අනුව පාලනය වේද යන්න මිනිසුන්ගේ සාමකාමී බව අනුව නිගමනය කළ හැකිය. සාමකාමී රටක් සාමකාමී ජාතියක් මුළු ලොවට ආදර්ශයක් වනු ඇත.



Scanned with CamScanner

## 62

# වරදට සමාව දීම තාඹවයි

තාඹව ඇත්තේ කොතැනද? එයයි විශ්වයේ හරිමැද. හොඳ මිනිසකු ජීවත් වනුයේද, නරක මිනිසා සමාව ලබනුයේද එකම හේතුවක් නිසාය. ඒ තාඹව නිසාය.

කරුණාවෙන් සැලකීමෙන් මිනිසුන්ගෙන් වැඩගත හැකිය. මිනිසුන්ට ගරු නම්බු දීමෙන් ඔවුන්ගෙන් හොඳහැටි වැඩගත හැකිය.

නමුත් තාඹව ඇත්තේ මිනිසුන්ගේ සිතුවිලිවලට ඉහළිනි. කොතරම් ඉහළින් ඇත්ද කියතොත් ළඟා වීමට බැරිතරම් ඉහළිනි. මිනිසුන් විසින් පාලකයන් වෙත කළ හැකි ලොකුම උදව්ව නම් මිලෙන් මුදලින් ශ්‍රමයෙන් ඔවුන් පිනවීම නොව, තාඹව අනුව රට පාලනය කරන හැටි කියා දීමයි.

පුරාතනයේ තාඹව අනුව රාජ්‍යය පාලන කරන සමයෙහි මිනිසුන්ගෙන් වරදක් වී නම් රජය ඔවුන්ට සමාව ලබා දුනි. එයයි සැබෑම පුදුමය.

## 63

# ප්‍රශ්නවලට සතුටින් මුහුණදීම තාඹවකි

කිසිවක් නොකර ප්‍රතිඵල ලබන ක්‍රම ඇත. මහන්සි නොවී ප්‍රතිඵල ලබන ක්‍රම ඇත. අපහසු දේ පහසු බව සිතන්න. එයින්ම පහසුවක් ලැබෙනු ඇත. කිරීමට අපහසු වුවද ඒ කාර්යය භාර ගන්න. අමාරු දේ කොටස්වලට බෙදා කොටසින් කොටස සම්පූර්ණ කරන්න.



CS Scanned with CamScanner

කුඩා ජයග්‍රහණ එක්වීමෙන් විශාල ජයග්‍රහණ අත්වෙයි. වැරදුනු තැන මදක් නැවතී වරද නිවරදි කර ඉදිරියට යන්න. තමන්ගේ සුවපහසුව ගැන පමණට වඩා නොසිතන්න. ප්‍රශ්නයක් පැමිණි කල ගණනට නොගත් බව අඟවාගෙන ඉන්න.

එයයි සැබෑ තාඕව.

## 64

## සියල්ල ස්වභාවික අනුපිළිවෙළට සිදුවණනට හරින්න

හොඳින් පැළවෙන්නේ හොඳින් මුල් ඇදගත් ගසයි. හොඳට නිවැරදි කළ හැක්කේ මේ දැන් සිදුවූ වැරදිය. ඉක්මනින් බිඳී යන්නේ පමණට වඩා දිළිසෙන දේය.

ඉක්මනින් තැළී පොඩිවන්නේ වඩාත්ම කුඩා දේය. අනතුර ළඟා වන්නට කලින් කල් දැන වැළැක්වීම තාඕවකි.

සියල්ල නිශ්චිත පූර්ව සැලසුමක් අනුව සිදුවෙයි. ඒ සැලසුම පළමුව වටහා ගන්න. කුඩා ඇටය මහ ගහක් බවට පත්වෙයි. දිග චාරිකාවක් එක් පියවරෙන් ඇරඹෙයි.

පමණට වැඩි වේගය ඔබ අසාර්ථක මිනිසකු කරනු ඇත. පමණට වැඩි බැඳීම අත්හැරීමට මුල්වනු ඇත. පමණට වැඩි ඉක්මන් කිරීම විනාශයට මුල්වනු ඇත.

සියල්ල ස්වභාවිකත්වයට අනුකූලව සිදුවේ නම් එයයි සියලු දෙය සිදුවිය යුතු අනුපිළිවෙළ. මුනිවරයාට ආරම්භයත් එකය. අවසානයත් එකය.

හේ මැදිහත් සිතින් යුතුව බලා සිටියි. හේතුව සරලය. ඔහුට අයත් කිසිවක් නැති බව දන්නා බැවිනි.



Scanned with CamScanner

ඔහුට නැතිවීමට දෙයක් නොමැති බැවිනි. ඔහු තෘෂ්ණාවෙන් මුක්ත වූ බැවිනි. ඔහුට ඉගෙනීමට තව කිසිවක් නොමැති බැවිනි. ඔහු මිනිසුන්ට ඒ දේ පැහැදිලි කර දෙනු ඇත. එයයි ඔහු ලොවට සලසන සෙත.

## 65

## දැනුම ගැන පමණට වඩා විශ්වාස නොකරන්න

පෙරකල පාලකයෝ ජනතාවගේ අධ්‍යාපනය නගා සිටුවීමට මහන්සි නොවූහ. මිනිසුන්ගේ නොදැනුවත්කම නිසා ඔවුන්ගේ පාලනය පහසු විය. පමණට වඩා දැනුවත් මිනිසුන් හැසිරවීම පවා දුෂ්කරය. උගතුන්ට වඩා නූගත්තු පහසුවෙන් තම ජීවිකාව සරි කර ගනිති.

උගත්කම හා දක්ෂකම ගැන පමණට වඩා විශ්වාසය නොතබන්න. සරලම වියමන පැහැදිලිම වියමන වෙයි. සරලව ගත කරන ජීවිතය පහසුම ජීවිතය වෙයි. ස්වභාවධර්මයට අනුකූලව ජීවත් වීමට මිනිසුන් හුරු කරවිය යුතුය.

## 66

## නායකයකු වීමට නම් නිහතමානී වන්න

සියලු ගංගාවෝ මුහුදට ගලා බසිති. මුහුදට ඇති බිය නිසා නොව මුහුද වඩා පහතින් පිහිටි බැවිනි. මේ පරම සත්‍යය ජීවිතයටද එක සේ අදාලය. නිහතමානිකම සැබෑ බලයේ පදනමයි. ඔබට අන්‍යයන් හසුරුවා ගැනීමට අවශ්‍යද? එසේනම් පළමුව ඔවුන්ට වඩා නිහතමානී වන්න.



CS Scanned with CamScanner

ඔබට නායකයකු වීමට අවශ්‍යද? එසේනම් පළමුව හොඳ අනුගාමිකයකු වන්න.

මුනිවරු සියලු පුහුදුන් ජනයාට වඩා ශ්‍රේෂ්ඨ වෙති. මුනිවරයාගේ සිත කිසි දින කම්පා නොවනු ඇත. ඔවුහු අන් අය ක්‍රියාවේ යොදවති. ක්‍රියාවේ යොදවන බව නොදැනෙන ලෙස.

මුනිවරු කිසිවකු හා තරගයට නොයති. එබැවින් මුළු ලොව ඔහුට ක්ෂේම භූමියකි. මන්දයත් කිසිවකු හා වෛරයක් නැති බැවිනි.

## 67

## සරල බව, ඉවසීම හා කරුණාව නිසැක ජය ගෙන දෙයි

සමහරු තාඕව ගැන සැක කරති. තවත් අය එය හුදු හිතළුවක් බව කියති. එනමුත් ජීවිතය ගැන හැරී බලන පුද්ගලයා තමා තුළින්ම තාඕව දකිනු ඇත.

අවුලක් සේ පෙනෙන තාඕව තමා තුළින්ම ලිහා දමනු ඇත. තාඕව ජීවිතයට මුසු කරන පුද්ගලයා නොබෝ කලින්ම ඵල නෙළා ගනු ඇත.

නිසැක ජය පිළිබඳ මූලධර්ම ඇත්තේ තුනකි. සරලබව, ඉවසීම හා කරුණාව ඒ මූලධර්ම තුන වෙයි. මේ කරුණු තුන ජීවිතයේ සෑම තැනකම ඇතිකරගන්න. ක්‍රියාවේදීද සිතුවිලි නැගීමේදීද හැකිතාක් සරල වන්න. සියලු දෑහි මූලික ස්වභාවය වටහා ගන්න. සතුරන් ඉදිරිපිටදීද මිතුරන් ඉදිරිපිටදීද ඉවසිලිවන්තව කටයුතු කරන්න.

පළමුව තමන් කෙරෙහි කරුණාවක් ඇතිකර ගන්න. දෙවනුව සියලු ලෝ වැස්සන්ට කරුණාව පතුරන්න.



CS Scanned with CamScanner

## 68

## ඔබේ සතුරන්ගෙන් ඔබේ තරම වටහා ගන්න

දක්ෂ මලල ක්‍රීඩකයෝ තම ප්‍රතිවාදීන්ද දක්ෂයන් වනු දැක්මට කැමති වෙති. දක්ෂ සේනාධිපති සතුරන්ගේ අරමුණු කල්තබා දැන ගනියි. දක්ෂ වෙළෙන්දා සාධාරණ වෙළඳාමෙහි යෙදෙයි. දක්ෂ පාලකයා මිනිසුන්ගේ සිතැඟි දැන රට පාලනය කරවයි.

අසම්පූර්ණත්වයෙන් සම්පූර්ණත්වයට පැමිණීම කාර්ය සාධනයේ නිමාව හඟවයි. හුදු සන්සන්දනයෙන් පමණක් සාර්ථකත්වය මැනීමට නොහැකිය. තාඹවට අනුව කටයුතු සිදුවුණේද යන්න සාර්ථකත්වය මනින නිවැරදි මිනුම් දණ්ඩයි.

## 69

## සතුරාගේ බලය අවතක්සේරු කිරීමෙන් වළකින්න

දක්ෂ හමුදා නායකයෝ මෙසේ කියති. පළමු ප්‍රහාරය එල්ල කිරීමට සූදානම්ව බලා හිඳින්න. අඩියක් ඉදිරියට තැබීමට වඩා යාරයක් පසුපසට ගැනීම ආරක්ෂාකාරීය. ඒ තාඹව ඉදිරියට නොගොස් ඉදිරිපත්වීම නම් වෙයි. සටනෙහිදී ආයුධ පිරිමසාගෙන පසුබැසීම නුවණට හුරුය.

සතුරාගේ බලය අවතක්සේරු කිරීම තරම් අඥාන තීරණයක් තවත් නැත. සතුරා අවතක්සේරු කිරීම යනු ඔහුගේ උපායට ගොදුරුවීමකි. සැබෑම සතුරන් දමනය යනු අභ්‍යන්තරයෙන් පැන නගින දුර්ගුණ නසා දැමීමයි. දෙපිරිසක් සටනට වන් කල අඩු මහන්සියෙන් වැඩ කිරීමට දත් අය ජය ලබති.



Scanned with CamScanner

## 70

## තාඕව කාලයට වඩා පැරණිය

මාගේ ඉගැන්වීම් සරලය. සුබාවබෝධය. පහසුවෙන් ජීවිතය හා මුසුකළ හැකිය. එනමුත් පුදුමය වන්නේ උගතුන් මා විශ්වාස නොකිරීමයි.

වඩාත්ම පුදුමය වන්නේ උගතුන් තාඕව අනුගමනය කරන්නට ගොස් බැරිව අත්හැර දැමීමයි. මාගේ ඉගැන්වීම් ලෝක ඉතිහාසයට වඩා පැරණිය.

එබැවින් ඒ ඉගැන්වීම්වල මුල සොයා යා නොහැකිය.

ඔබට මා හඳුනාගැනීමට අවශ්‍යද? එසේ නම් ඔබේ හදගැස්ම විමසා බලන්න. ඒ තුළින් මා ඔබට දිස්වනු ඇත.

## 71

## නොදන්නා බව දැන ගැනීම දැනුවත්වීමේ ආරම්භයයි

වටිනාම දැනුම නම් නොදන්නා බව දැනුමයි. දන්නා බව හඟවමින් සමාජයේ ගැවසීම මානසික රෝගයකි.

රෝගාතුර බව තේරුම්ගන්නා තෙක් නිරෝගී සැපත වෙත පියවර නැගිය නොහැකිය.

හැබෑ දක්ෂයාගේ වෙදා වනුයේත් ඔහුමය.

දැනුම යන දෙයින් මනස හිස් කළ විට සියල්ල දැන ගැනීම යන ප්‍රතිඵලය අත් වෙයි.



Scanned with CamScanner

## 72

## මිනිසුන් හැසිරවිය යුත්තේ මනුෂ්‍යත්වයෙනි

මනුෂ්‍යත්වයෙන් මිනිසුන් හැසිවීම අවසන් වූ කල්හි ආගම ඒ තැන ගනියි. මිනිසුන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය අවසන් වූ කල්හි රාජ්‍යය බිහිවිය. මුනිවරු මේ ක්‍රියාදාමය ආපිට හරවති. ඔවුහු ඉගැන්වීමෙන් තොරව අවබෝධ කරවීමෙහි දක්ෂ වෙති.

## 73

## සරල මාර්ගය නිවැරදි මාර්ගයයි

තාඕව හැමවිටම සරල මගයි. තාඕව කවරාකාරද යත්, සටනක් නොමැතිව ජය ගැනීම තාඕවේ මගයි. වචන නොමැතිව පිළිතුරු දීමේ මගයි. කැඳවීමකින් තොරව මිනිසුන් රැස් කිරීමේ මගයි. සැලසුමක් නැතිව ජය ගැනීමේ මගයි. තාඕව මුළු විශ්වය තුළ ව්‍යාප්ත ධර්මතාවයකි. තාඕව අනුව දිවි ගෙවවහොත් වැරදීමට හේතුවක්ද නැත.

## 74

## ස්වභාවධර්මයට එරෙහි වීම විනාශයේ මුලයි

සියල්ල අනිත්‍යය. අනිත්‍යතාධර්මය දැන හැඳිනගත හොත් ඔබ කිසිවක් ගැන ආශා නොකරනු ඇත. ඔබ මියැදෙන්නට බයද?



CS Scanned with CamScanner

එසේනම් ඔබට කිසිදු ජයග්‍රහණයක් අත්පත් කරගත නොහැකිය. ස්වභාවධර්මයට අභියෝග කරන තැනැත්තා වඩුවකුගේ ආයුධ සොරා ගෙන වඩුකම් කරන ආධුනිකයකු වැනිය. හේ වඩා හොඳ ලෝකයක් නිර්මාණය කරන්නට ගොස් ලෝකය විනාශ කර දමයි.

## 75

## බදු වැඩි කරන තරමට රජය පිරිහෙයි

රජය අයබදු වැඩිකරන තරමට මිනිසුන් අතර සාගින්න වැඩිවෙයි. රජයේ මැදිහත් වීම වැඩිවන තරමට මිනිසුන්ගේ කලකිරීම වැඩි වෙයි. රජයේ පරම යුතුකම වනුයේ මිනිසුන්ට යහපත සැලසීමයි. අනුන්ට යහපතම සලසන්න. ආපිට යමක් නොයදින්න.

## 76

## මෘදු ලෙස ජීවත් වී ආයුෂ වැඩි කරගන්න

ජීවත් වන කල්හි සිරුර මෘදුය. කර්මණ්‍යය. මළගිය කල්හි සිරුර රළුය. දරදඬුය. පණඇති ගස් මෘදුය. නැවෙනසුලුය. වියලුණු ගස් දැඩිය. බිඳෙනසුලුය.

යමෙක් රළු හා වෙනස් නොවන සුළුනම් ඔහුගේ කාලය ඉක්මනින් අවසන් වන බව එයින්ම දැනගත යුතුය. යමකු මෘදුව හා නම්‍යශීලීව ක්‍රියා කරන්නේ නම් ඔහු තව බොහෝ කලක් වැඩෙහි යෙදෙනු ඇත. රළු හා දැඩි දෙය බිඳෙනු ඇත. මෘදු හා නම්‍යශීලී දෙය බොහෝකල් පවතිනු ඇත.



CS Scanned with CamScanner

77

## දෙන තරමට ලැබීම වැඩි වේ

තෘෂ්ණාව අනුව ජීවත්වීම දුන්නක් ඇදීමට සම කළ හැකිය. දුන්නෙහි යට කොන ඉහළටද උඩකොන යටටද ඇදෙයි. දුන්න පමණට වැඩියෙන් ඇද්දොත් එය බිඳී යයි. පමණට වැඩි වෙහෙසීමෙන් සියල්ල අහිමිව යයි.

අනුන් පෙළමින් පාලනය කරන තැනැත්තාද, අවි බලයෙන් රට කරවන තැනැත්තාද තෘෂ්ණාවේ මගෙන් ඉවත්ව ගමන් කරයි.

නැති මිනිහාගෙන් ගැනීමත් ඇති මිනිහාට තව තවත් දීමත් අඥාන පාලකයාගේ ලක්ෂණයකි. දෙන්නන්ටම ලැබේ යන්න එක්තරා තෘෂ්ණාවකි. අනුන්ට දන් දෙන්න. ආපිට ඔවුන්ගෙන් කිසිවක් බලාපොරොත්තු නොවන්න. ණය නොවී ජීවත් වන්න. එය වඩාත් නිවැරදි ජීවන මාර්ගයයි.

77

## ජලය උපමා කර ජීවත් වන්න

ජලය තරම් මුදු හා ප්‍රයෝජනවත් දෙයක් ලොව නැත. එනමුත් ජලය තරම් හොඳින් විවිධ දේ දියකර දැමිය හැකි දෙයක්ද ලොව නැත. කිසිවක් ජලය හා සම නොවන්නේ එබැවිනි.

මෘදු දෙයින් රළු දෙය ජයගත හැකිය. මහත්මාගුණයෙන් ප්‍රචණ්ඩබව ජයගත හැකිය. සියලු දෙන මේ කරුණු දනිති. හැබැයි, ප්‍රායෝගිකව භාවිත නොකරති.



Scanned with CamScanner

දුක සැප දෙකෙහි සම සිත් ඇති කරගන්න. එකල්හි ඔබ පැරදවීම සිහිනයක් වනු ඇත. අත්හැර දැමීම තරම් සැනසුමක් ලොව නැත. ලොව ඇති පුදුම දෙය නම් සත්‍යය පමණ ඉක්මවා හාස්‍යජනක වීමයි.

## 79

## අනුන් මත යැපීම අවදානම්ය

පරාජය පසුතැවීමට හේතුවක් නොවේ. පරාජය යනු ජයග්‍රහණය ලැබීමට වෙනත් අවස්ථාවක් පාදා දීමකි. ඔබගේ පරාජයට අනුන්ට බණින්න පටන් ගතහොත් ඒ බැණුම් කිසිදින අවසන් කළ නොහැකි වනු ඇත. පළමුව ඔබේ යුතුකම් ඉටු කරන්න. දෙවනුව ඔබේ දුබලතා පිටුදකින්න. කළයුත්ත වහාම ඉටුකරන්න. අනුන්ගෙන් උදව් ඉල්ලාගෙන ජීවත් නොවන්න.

## 80

## මිනිසුන් සතුටින් තැබීම පාලකයාගේ වගකීමයි

රටක පාලකයා යහපත් අයකු නම් මිනිස්සු සතුටින් දිවි ගෙවති. සේවකයෝ සතුටින් රාජකාරි කරති. වැඩ කිරීම පවා ඔවුන්ට සතුටකි. රටක් සමෘද්ධිමත් වන තරමට මිනිස්සු නිවසේ රැඳී සිටීම ප්‍රිය කරති. සමෘද්ධිමත් රටවල මිනිස්සු අන් රටවල විසීම අප්‍රිය කරති.

සමෘධිමත් රටක හමුදාව සතුව අවි ආයුධ ඇත. නමුත් ඒවා පාවිච්චියක් සිදු නොවේ.



Scanned with CamScanner

මිනිසුන් සතුටු සාමීචියේ යෙදෙමින් ආහාර ගනු දැකීම තාඕවට අනුව පාලනය වන රටක ලක්‍ෂණයකි. මිනිසුන් ගෙවතුවල උයන්වල සතුටින් වෙසෙනු දැකීම තාඕව අනුව පාලනය වන රටක ලක්‍ෂණයකි.

තාඕව අනුව පාලනය වන රටවල් ගැන අනිත් රටවලද කතාබහ වනු ඇත. මිනිසුන් බොහෝ වයෝවෘද්ධ වන තෙක් ජීවත්වීමද තාඕව අනුව පාලනය කරන රටවල ලක්‍ෂණයකි.

## 81
## මිනිසුන්ට නොදැනෙන්න ඔවුන් හසුරුවන්න

සත්‍යය සාටෝපවත් නැත. සාටෝපවත් වදන් සත්‍යයද නොවේ. නුවණැති මිනිසුන් කියන දේ ඔප්පු කිරීමට වෙහෙසිය යුතුද නොවේ. යමක් ඔප්පු කර පෙන්වන්න යනුවෙන් ඉල්ලන අය නැණවතුන් නොවේ.

මුනිවරුන්ට කිසිවක් අයිති නැත. ඔවුහු අනුන් සැනහීමෙන් සැනහීමට පත්වෙති. ඔවුන් අනුන්ට දීමෙන් තෘප්තියට පත් වෙති. බල නොකිරීම තාඕවේ ගුණයකි. අනුන් යටපත් නොකිරීමෙන් ඔවුන් පාලනය කිරීම තාඕව අනුව ජීවත් වීම නම් වේ.




Scanned with CamScanner

Scanned with CamScanner

Scanned with CamScanner

චීනයේ ජීවත් වූ ල ඔන්සු නම් අග්‍රගණ්‍යයේ බුද්ධිමතා විසින්
හෙළි කරන ලද ජයග්‍රහණයේ රහස් උපදෙස් අසූ එකක්
ඇතුළත් සුවිශේෂී ග්‍රන්ථයකි.



# TAO TE CHING

තාඕ දර්ශනය හෙවත්

# සාර්ථකත්වයේ ස්වර්ණමය රහස්




සුසර ප්‍රකාශකයෝ
LG.180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
Tele : 0112 430721 Fax : 0112 334597
E-mail : susarapub@gmail.com
Printed & Compiled by: Susara Printers, No:338/A, Gonahena, Kadawatha.
www.susarapublication.lk www.facebook.com/susarapublications


BB119

Rs. 150.00


Samanala 457
RS. 150.00
00070152-1
Tao Te Ching
1019
Scanned with CamScanner